# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2118/40 - 2019 අප්‍රේල් මස 09 වැනි අඟහරුවාදා - 2019.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය

දකුණු පළාත් සභාව විසින් 2019 මාර්තු මස 26 වැනි දින අනුමත කරනු ලදුව දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2019 අප්‍රේල් මස 01 වැනි දින අනුමත කළ දකුණු පළාතේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය ආණ්ඩුකාර අනුමැතිය ලද 2019 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන බව දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජලසම්පාදන හා ජලාපවහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්, වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන පිළිබඳ අමාත්‍ය උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක වන මම, මෙයින් දැනුම් දෙමි.

**උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,**
දකුණු පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග,
ජල සම්පාදන හා ජලාපවාහන, ආහාර හා සැපයුම් හා බෙදාහැරීම්,
වෙළෙඳ සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය.

2019 අප්‍රේල් මස 01 වැනි දින,
4 මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල,
දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය කාර්යාලයේ දී ය.

## දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්ති කෙටුම්පත

දකුණු පළාත තුළ සමුපකාර සමිති සංවිධානය, ලියාපදිංචි කිරීම, අධීක්ෂණය, පාලනය, විගණනය, සමුපකාර අධ්‍යාපනය හා ප්‍රචාරණය හා සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, සමුපකාර සමිති පිහිටුවීම හා පරිපාලනයට අදාළ ලිඛිත නීතිය නිශ්චය කොට දැක්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තියෙන් 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 9(4), 9(5), 24, 24(ඇ), 25, 26, 28(1), 28(2), 29(1), 29(2), 44(2)(1)(අ), 53(2), 58(1)(ඉ), 61(2)(උ), 61(2)(එ), 71, 75 බැංකුව යන්නෙන් (අ) (ආ) (ඇ) වගන්ති හැර සෙසු වගන්ති අනනුකූල කෙරේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාත් සභාවේ ආණ්ඩුකාරවර විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය.

### *1 වන පරිච්ඡේදය*

### ලියාපදිංචි කිරීම

පත් කිරීම හා පත් කරන ලද තැනැත්තන්ගේ බලතල.

2. (1) ශ්‍රී ලංකාවේ දකුණු පළාත සඳහා සමුපකාර සංවර්ධන පළාත් කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයෙකු පත්කරනු ලැබිය යුතුය. එසේම අවශ්‍ය විය හැකි පළාත් නියෝජ්‍ය කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන් සහ සහකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන් සංඛ්‍යාවක් පත්කරනු ලැබිය හැකිය.

(2) දකුණු පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් විශේෂ හෝ සාමාන්‍ය නියෝගයන් මගින් පළාත් නියෝජ්‍ය කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන් සහ සහකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන්ට මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඊට අදාළව පනවනු ලබන රීතිවල සඳහන් පළාත් කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා සතු සියලුම බලතල හෝ ඉන් කොටසක් හෝ පැවරිය හැකිය.

(3) සමුපකාර සංවර්ධන පළාත් කොමසාරිස් වශයෙන් හෝ සමුපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන් තත්කාලයේ ක්‍රියාකරන තැනැත්තාට, දකුණු පළාත තුළ තත් කාලයෙහි ක්‍රියාකිරීමට පත්කරනු ලබන හෝ ක්‍රියාකරනු ලබන තැනැත්තාට මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඊට අදාළව සාදනු ලැබූ හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන යම් රීතිවලින් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පවරනු ලැබූ බලතලම තිබිය යුතු අතර, ඔහු විසින් ඒ බලතල ක්‍රියාවේ යෙදවිය හැකිය.

(4) සමුපකාර සංවර්ධන පළාත් කොමසාරිස්වරයාට සහාය වීම පිණිස පත්කරනු ලබන එක් එක් තැනැත්තාට, මේ ප්‍රඥප්තිය යටතේ සහ ඒ යටතේ සාදනු ලැබූ හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන යම් රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයා සතු බලතල අතුරින් ඔහු අදහස් කරනු ලබන ආකාරයට මේ වගන්තිය යටතේ කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් බලතල තිබිය යුතු අතර, ඒ එක් එක් තැනැත්තා විසින් ඒ බලතල ක්‍රියාත්මක කළ හැකිය.

ලියාපදිංචි කරනු ලැබිය හැකි සමිති.

3. මෙහි මින් මතු අඩංගු කරනු ලබන විධිවිධානවලට යටත්ව,

(1) ස්වකීය සාමාජිකයන්ගේ ආර්ථික, අධ්‍යාපනික, සාමාජීය හා සංස්කෘතික සුභ සාධනයට හේතු වන ආසක්තතා දියුණු කිරීම අරමුණු කරගත් සහ ස්වේච්ඡාවෙන් සංවිධානය වී සමුපකාර අනන්‍යතාවය ආරක්ෂාකර ගනිමින් සමුපකාර ප්‍රතිපත්ති සහ සාරධර්මවලට අනුකූල සංවිධානයක් සහ ව්‍යවසායකත්වයක් ලෙස පවත්වාගෙන යාම අරමුණු වශයෙන් යුක්ත සමිතියක්,

හෝ

(1) වන ඡේදයෙහි සඳහන් සමිතිවල ක්‍රියාකාරිත්වය පහසු කිරීමේ අරමුණු ඇතිව පිහිටුවන ලද ස්වකීය සාමාජිකයන් වශයෙන් ලියාපදිංචි සමිතිවලින් සමන්විත සමිතියක්,
සීමාසහිත වගකීම් ඇතිව හෝ නැතිව මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකිය. එසේ වුවද ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් සාමාජිකයෙකු වන සමිතියක වගකීම සීමාසහිත වන්නේය.

(2) සමිතියක සාමාජිකයින්ගේ වගකීම සීමාකරනු ලැබූ අවස්ථාවක ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් නොවන කිසිම සාමාජිකයෙකු විසින් පහෙන් එකක උපරිම ප්‍රමාණයකට යටත්ව, ඒ සමිතියේ කොටස් ප්‍රාග්ධනයෙන් රීතිවලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් නොදැරිය යුතුය.

4. (1) (අ) සමිතිය සාමාජිකයින්ගෙන් පමණක් සමන්විත වන අවස්ථාවක, ලියාපදිංචි කිරීම කොන්දේසි.

සාමාජිකත්වය වයස අවුරුදු දහඅටට වැඩි වූද, සමිතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටින්නා වූ සේවයෙහි නියුක්ත සිටින්නා වූ හෝ නිශ්චල දේපළ අයත්ව සිටින්නා වූද සමිතිය විසින් ඉටුකරනු ලබන සේවාවන් උපයෝගි කිරීමේ ශක්නුතාවය ඇත්තා වූද, සාමාජිකයන් යටත් පිරිසෙයින් විසිදෙනෙකුගෙන්වත් සමන්විත නොවන්නේ නම් ; හෝ

(ආ) (i) ලියාපදිංචි සමිතිවලින් පමණක් එය සමන්විත වන්නේ නම් සහ යටත් පිරිසෙයින් ලියාපදිංචි සමිති පහක් හෝ එකම ව්‍යාපාරික අරමුණින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතිවලින් සියයට පනහ හෝ යන දෙකෙන් වැඩි ගණනක් ඊට නොමැති නම් හා එම ව්‍යාපාරික අරමුණින් එම දිස්ත්‍රික්කය තුළ වෙනත් සංගමයක් ලියාපදිංචි වී නැත්නම්,

(ii) සමිතිවල සාමාජිකත්වයෙන් යුත් සමිතිවලින් සැදුම්ලත් සමිති මගින් පළාත් සමිතියක් හෝ සංගමයක් පිහිටුවනු ලබන්නේ නම් ලියාපදිංචි සමිති තුනක්වත් ඊට නොමැති නම්,

(ඇ) (i) සමිතිය විසින් නිරත වීමට යෝජනා කරනු ලබන කටයුතු ආර්ථික වශයෙන් යෝග්‍ය බවට ;

(ii) සමිතිය විසින් යෝජිත අතුරු ව්‍යවස්ථාව, මේ ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ සාදන ලද හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන රීතිවල විධිවිධානවලට අනුකූල වන බවට;

කොමසාරිස්වරයා විසින් නියම කර ඇත්තා වූ යම් තැනැත්තෙකුගෙන් හෝ ආයතනයකින් වාර්තාවක් හෝ නිර්දේශයක් සමිතිය විසින් ලබාගෙන නොමැති නම්,

(ඈ) යෝජිත අතුරු ව්‍යවස්ථා, තත්කාර්යය සඳහා යථා පරිදි කැඳවන ලද මහා සභා රැස්වීමක දී සම්මත කරනු ලැබ නොමැති නම්,

(ඉ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය අත්සන් කරන සියලු ම සාමාජිකයන් විසින් තම සාමාජිකත්වය සම්බන්ධයෙන් වූ ගෙවීම් සම්පූර්ණ කොට නොමැති නම්,

(ඊ) සමාන ව්‍යවසායක අරමුණින් යුතුව එම බල ප්‍රදේශය තුළ වෙනත් සමිතියක් ලියාපදිංචි වී ඇත්නම් හෝ සමිතියක් ලියාපදිංචි වී ඇති අවස්ථාවක, එකී ලියාපදිංචි සමුපකාර සමිතියේ මහාසභාව යෝජිත සමුපකාර සමිතිය ලියාපදිංචි කිරීමට එකඟත්වය පළකිරීමට යෝජනාවක් සම්මත කර මහා සභාව එකඟත්වය පළකර නැත්නම්,

(උ) සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් අතරින් යටත් පිරිසෙයින් දෙදෙනෙකුවත්, වයස අවුරුදු දහඅටත් තිස්පහත් අතර විය යුතු තැනැත්තන් වන බවට විධානයක් සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් නොවන්නේ නම් සහ ඒ අනුව පත්වී නොමැති නම්,

(ඌ) යෝජිත සමිතියේ ආර්ථික හා සංවිධාන ශක්‍යතාවය හය මසක් තුළ ක්‍රියාත්මකව පැවති බව ඔප්පු කර නැත්නම්,

(එ) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන සියලු තොරතුරු සැපයීම ඒ සමිතිය විසින් පැහැර හැර ඇත්නම්,

කිසිම සමිතියක් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.

එසේ වුවද යම් සමිතියක් හෝ ලියාපදිංචි සමිතිවලින් සමන්විත වන සමිතියක් ලියාපදිංචි කිරීමේදී ඉහත (උ) උපවගන්තිය යටතේ දක්වා ඇති වයස් සීමාව නිදහස් කිරීමේ හෝ වෙනස් කිරීමේ බලය සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයාට ඇත්තේය.

(2) ඉහත (1) උපවගන්තියෙහි කරුණු කෙසේ වුවත්, යෝජිත සමිතිය ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් නොවන කිනම් හෝ අවස්ථාවක කිසිම සමිතියක් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.

(3) මේ වගන්තියේ කාර්යයන් සඳහා ඉහතින් වූ විධිවිධානවල සඳහන් කොන්දේසි සෑහීමකට පත්කර ඇති බවට යම් ප්‍රශ්නයක් පැනනගින අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතුය.

(4) සීමාසහිත වගකීමක් ඇතිව හෝ නැතිව මේ ප්‍රඥප්තිය යටතේ සමිතියක් ලියාපදිංචි කරනු ලැබිය හැකිය. එසේ ලියාපදිංචි කරනු ලැබූ සීමාසහිත වගකීම්වලින් යුත් සෑම සමිතියකම නමෙහි "සීමාසහිත"යන වචනය මුල් වචනය විය යුතුය. නැතහොත් එහි දෙමළ හෝ ඉංග්‍රීසි වචනය ඒ නමේ කොටසක් විය යුතුය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

5. (1) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලැබූ යම් ආකාරයක් අනුව වූ ඉල්ලුම්පත්‍රයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) ඒ ඉල්ලුම්පත්‍රය -

(අ) ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් සාමාජිකයෙකු නොවන සමිතියක්, සම්බන්ධයෙන් වූ විට 4(1)(අ) වන උපවගන්තියේ නියමයන් අනුව සුදුසුකම්ලත් තැනැත්තන් යටත් පිරිසෙයින් විසිදෙනෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

(ආ) ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයෙකු වන, සමිතියක් සම්බන්ධයෙන් වූ විට ලියාපදිංචි කළ එවැනි සෑම සමිතියක් වෙනුවෙන්ම යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තන් විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

(3) ඉල්ලුම්පත්‍රය සමග -

(අ) යෝජිත අතුරු ව්‍යවස්ථාවල පිටපත් දෙකක්,

(ආ) සමිතිය නිරතවීමට යෝජනා කරනු ලබන ආර්ථික කටයුතුවලට අදාළ යෝග්‍යතා වාර්තාවක්,

(ඇ) සමිතිය ලියාපදිංචි කිරීම පිණිස යෝජනාව සම්මත කරනු ලැබූ මහා සභා රැස්වීම් වාර්තාවේ සහ පැමිණීම සම්බන්ධයෙන් විස්තර වාර්තාවේ සහ අතුරු ව්‍යවස්ථාව සම්මත කරනු ලැබූ වාර්තාවේ හෝ වාර්තාවල සහතික පිටපත්,

(ඈ) ඉල්ලුම්පත්‍රය අත්සන් කරන සාමාජිකයින් විසින් සාමාජික කොටස් ගෙවනු ලැබීම ස්ථිර කෙරෙන සහ ඒ මුදල් එම කාරක සභාවේ භාරකාරත්වයේ පවතින බවට සමිතියේ කාරක සභාව විසින් සහතිකයක් අත්සන් කර ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ඉ) රෙජිස්ට්‍රාර්වරයා විසින් අයදුම්පතට අදාළව ඉල්ලා සිටින ඕනෑම තොරතුරක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

ලියාපදිංචි කිරීම.

6. සමිතියක් විසින් මේ ප්‍රඥප්තිය හා රීතිවල විධිවිධානවලට අනුව ක්‍රියාකර ඇති බවට, ඒ සමිතිය නියුක්ත වීමට අදහස් කරන කටයුතු ආර්ථික වශයෙන් ශක්‍ය බවට හා සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථාවේ මේ ප්‍රඥප්තියට හා රීතිවලට පටහැනි නොවන බවට හා අදාළ සමිතිය යටත් පිරිසෙයින් මාස හයක්වත් ක්‍රියාකාරිත්වයේ තිබුණ බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන්නේ නම් හා තමා සුදුසු යැයි සලකන්නේ නම් ඔහු විසින් ඒ සමිතිය හා එහි අතුරු ව්‍යවස්ථා ලියාපදිංචිය සඳහා ඉල්ලීමක්

ලැබී දින හැටක් ඇතුළත ලියාපදිංචි කළ හැකිය. යම් සමිතියක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඒ බව ඉල්ලුම්කරුවන්ට ඉහත දින හැටක සීමාව ඉක්මවීමට පෙර දැනුම් දිය යුතුය. එවැනි ප්‍රතික්ෂේප කිරීමකට එරෙහිව අභියාචනයක්, රෙජිස්ට්‍රාර්වරයාගේ ලිපියෙහි සඳහන් දින සිට දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම්පත්‍රයට අත්සන් කළ ඕනෑම අයෙකුට ඉදිරිපත් කළ හැකි විය යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අභියාචනයේ සඳහන් දින සිට දින හැටක් ඇතුළත තීරණය ලබා දිය යුතුය.

ලියාපදිංචි කිරීම සඳහා සාක්ෂි.

7. (1) සමිතියක් ලියාපදිංචි කරනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඒ සහතිකයේ සඳහන් සමිතියෙහි ලියාපදිංචි කිරීම අවලංගු කර ඇති බව ඔප්පු කළහොත් මිස, ඒ සමිතිය යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම.

8. (1) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ ප්‍රඥප්තියට හා ඒ යටතේ සාදනු ලැබූ රීතිවලට යටත්ව, සමිතියේ නම ප්‍රකාශ කරන අතුරු ව්‍යවස්ථාව ඇතුළු සමිතියේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියක කිසිම අතුරු ව්‍යවස්ථා සංශෝධනයක්, ඒ සංශෝධනය මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන තෙක් වලංගු නොවිය යුතුය. ඒ කාර්යය සඳහා ඒ සංශෝධනයේ පිටපත් දෙකක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වූ සංශෝධනයක්,අවශ්‍ය අවස්ථාවක 4(1)(ඇ) සහ (ඈ)අනු වගන්තිවල සඳහන් වාර්තාවන් සහ රීතිවලින් නියම කර ඇති සහ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන තොරතුරු හා වාර්තා සමග ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස ඒ සංශෝධනය ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.

(4) (අ) අතුරු ව්‍යවස්ථාවල යම් සංශෝධනයක් මේ ප්‍රඥප්තියට හෝ රීතිවල විධිවිධානවලට පටහැනි නොවන බව රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වන්නේ නම් තමා සුදුසු යැයි සලකතහොත් ඔහු විසින් ඒ සංශෝධනය දින හැටක් ඇතුළත ලියාපදිංචි කළයුතුය. එම අතුරු ව්‍යවස්ථාව සංශෝධනය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඉහත කී දින හැටක කාලය ඉක්මවීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා අදාළ සමිතියට දැනුම් දිය යුතුය. එවැනි ප්‍රතික්ෂේප කිරීමකට එරෙහිව අභියාචනයක්, රෙජිස්ට්‍රාර්වරයාගේ ලිපියෙහි සඳහන් දින සිට දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකි විය යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අභියාචනයේ සඳහන් දින සිට දින හැටක් ඇතුළත ඔහුගේ තීරණය ලබා දිය යුතුය.

(ආ) ඉහත(අ) උපවගන්තිය යටතේ ඉදිරිපත්වන අභියාචනාවලට අදාළව අමාත්‍යවරයා විසින් ක්‍රියා කළයුතු ආකාරය මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතුය.

(5) සමිතියක නාමයක් වෙනස් කරන සංශෝධනයක් ඒ සමිතියේ හෝ එහි යම් සාමාජිකයන්ගේ හෝ හිටපු සාමාජිකයන්ගේ යම් අයිතිවාසිකමක් හෝ බැඳීමක් කෙරෙහි බලනොපෑ යුතු අතර, එවකට පවත්නා යම් නීති කෘත්‍යක් එහි අළුත් නාමය යටතේ ඒ සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරියටත් පවත්වාගෙන යනු ලැබිය හැකිය.

(6) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක තමා විසින් සහතික කරන ලද ඒ සංශෝධනයේ පිටපතක් ඔහු විසින් සමිතිය වෙත නිකුත් කළ යුතුය. ඒ සංශෝධනය යථා පරිදි ලියාපදිංචි කර ඇති බවට ඒ සංශෝධනයේ සහතික කරනු ලැබූ පිටපත තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

(7) මේ වගන්තියෙහි "සංශෝධනය" යන්නට අළුත් අතුරු ව්‍යවස්ථාවක් සැදීම හා අතුරු ව්‍යවස්ථාවක් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම ඇතුළත් වේ.

(8) මෙම ප්‍රඥප්තිය යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් විසින් අනුමත කරනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක්ම මෙම ප්‍රඥප්තිය හා ඒ යටතේ සාදනු රීතිවලට යටත්ව ක්‍රියාත්මක විය යුතුය.

ලියාපදිංචි සමිතිවල වත්කම් හා බැරකම් ඒකාබද්ධ කිරීම, බෙදීම හා පැවරීම.

9. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින්, කලින් ලබාගත් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ඇතිව හා ඒ සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකක වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින් -

(අ) සමිතියේ වත්කම් හා බැරකම් සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් යම් ලියාපදිංචි කරනු ලැබූ අන්කිසි සමිතියකට පැවරීම, හෝ

(ආ) සමිතිය, සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් වශයෙන් බෙදා වෙන්කරගැනීම කළ හැකිය.

(2) යම් ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් විසින්, රෙජිස්ට්‍රාර්වරයාගේ කලින් ලබාගත් අනුමැතිය ඇතිව හා ඒ එක් එක් සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන යෝජනාවකින් ඒකාබද්ධ වී අළුත් සමිතියක් පිහිටුවාගත හැකිය.

(3) (අ) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සම්මත කරගනු ලබන යෝජනාවක අවස්ථාවෝචිත පරිදි පැවරීම, බෙදා වෙන්කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ සියලු විස්තර අඩංගු විය යුතුය.

(ආ) යෝජිත පැවරීමේ, බෙදා වෙන් කිරීමේ හෝ ඒකාබද්ධ වීමේ යෝග්‍යතාව සම්බන්ධයෙන් කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් වාර්තාවක් කැඳවිය හැකි අතර යෝජිත පැවරීම, බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ වීම සම්බන්ධයෙන් කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණයක් ගත යුතුය. එකී තීරණය අවසානාත්මක වන්නේය.

(ඇ) ඉහත (1) හෝ (2) උපවගන්ති අනුව කටයුතු කිරීමට අනුමැතිය දෙනු ලැබුවහොත් එය ක්‍රියාත්මක කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයාට අවශ්‍ය යැයි හැඟෙන, එම කාර්යය කිරීම උදෙසා එක් තැනැත්තෙකුගේ හෝ තැනැත්තන් කිහිපදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් රෙජිස්ට්‍රාර් විසින් පත්කරනු ලැබිය හැකිය. එම තැනැත්තාට හෝ මණ්ඩලයට එම කාර්යය ඉටුකිරීමට බලය තිබිය යුතුය.

(4) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ වගන්තිය යටතේ සම්මතකර ගත් යෝජනාවකට යම් වත්කම් හා බැරකම් පැවරීමක් ඇතුළත්වන අවස්ථාවක, තත්කාලයෙහි බලපවත්නා යම් නීතියකට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එය නොතකා ඒ සම්මත කරගත් යෝජනාව තවදුරටත් තහවුරු කිරීමක් නොමැතිව පැවරීම්ලාභීන් වෙත ඒ වත්කම් හා බැරකම් සතු කිරීම ප්‍රමාණවත් පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතුය.

ඇතැම් අවස්ථාවලදී ලියාපදිංචි සමිතිවල ලියාපදිංචි කිරීම් සහතික අවලංගු කිරීම.

10. (1) ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා බැරකම් සියල්ලම වෙනත් ලියාපදිංචි කළ සමිතියකට මේ ප්‍රඥප්තියේ සඳහන් වූ විධිවිධාන අනුව පවරනු ලැබූ අවස්ථාවක පළමුව සඳහන් වූ සමිතියේ ලියාපදිංචි කිරීම අවලංගු විය යුතු අතර, ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන අනුව අළුත් සමිතියක් වශයෙන් ඒකාබද්ධ කරනු ලැබූ අවස්ථාවක ඒකාබද්ධ කරනු ලැබූ ඒ එක් එක් සමිතියේ ලියාපදිංචි කිරීම අළුත් සමිතිය ලියාපදිංචි කරනු ලැබූ දිනයෙහි අවලංගු වියයුතු අතර, ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක් මේ ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන අනුව සමිති දෙකකට හෝ වැඩි ගණනකට වෙන්ව බෙදීයන අවස්ථාවක ඒ සමිතියේ ලියාපදිංචි කිරීම අළුත් සමිති ලියාපදිංචි

කිරීමෙන් පසු අවලංගු වියයුතු අතර, ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතුය.

*2 වන පරිච්ඡේදය*

**ලියාපදිංචි කරනු ලැබූ සමිතිවල සාමාජිකයින් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම්**

11. (1) සාමාජිකත්වය සම්බන්ධයෙන් රීතිවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි යම් ගෙවීමක් තමා විසින් කරනු ලැබ ඇත්නම් මිස හෝ කරනු ලබන තෙක් නැතහොත් සමිතියෙහි එසේ නියම කරනු ලැබිය හැකි යම් සම්බන්ධතාවක් අත්කර ගනු ලැබ ඇත්නම් මිස හෝ අත්කරගනු ලබන තෙක් ලියාපදිංචි කළ සමිතියක කිසිම සාමාජිකයෙකු විසින් සාමාජිකයෙකුගේ අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතුය.

අයවිය යුතු ගෙවීම් කරනු ලබන තෙක් සාමාජිකයන් විසින් අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතු බව.

(2) සමිතිය වෙත (1) වන උප වගන්තියේ සඳහන් යම් ගෙවීමක් කරනු ලැබ නැති හෝ ඒ සමිතියේ එම උප වගන්තියේ සඳහන් යම් සම්බන්ධතාවක් අත්කර ගෙන නැති අවස්ථාවක ඒ සාමාජිකයාගෙන් (1) වන උප වගන්තියේ සඳහන් ඒ ගෙවීම හෝ ඒ සම්බන්ධතාව සම්බන්ධයෙන් අයවිය යුතු මුදලක් වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයක අනුයෝජිතයෙකු වශයෙන් යම් උප ලේඛනගත කෘෂිකාර්මික නිෂ්පාදනයක් මිලට ගැනීම සම්බන්ධයෙන් සාමාජිකයාට සමිතියෙන් ගෙවිය යුතු යම් මුදලකින් සමිතිය විසින් අඩු කර ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

(3) (අ) සමුපකාර සමිතියක සාමාජිකයෙකු විසින් මිලයට ගතයුතු එක් කොටසක අවම වටිනාකම රුපියල් පන්සියයකි. එක කොටසක අවම වටිනාකම සාමාජිකත්වයට බැඳුනු දින සිට වසරක් තුළ ගෙවා නිමකළ යුතුය. එහෙත් පාසල් සමුපකාර සමිති සඳහා මෙම විධිවිධානයන් බලනොපැවැත්විය යුතු අතර රීති මගින් පනවා ඇති හෝ පනවනු ලබන විධිවිධානයන් අදාළ වේ.

(ආ) සාමාජිකයෙකු විසින් යම් කොටසක් මිලට ගැනීම සඳහා ගෙවීම රුපියල් පනහක අවම මූලික ගෙවීමකින් ආරම්භ කළ හැකි අතර ඒ මූලික ගෙවීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත ඒ වාරිකය ගෙවීම රුපියල් පන්සියයකට වැඩි කරනු ලැබිය යුතුය. අවම වටිනාකම කැමැත්ත පරිදි වැඩි කරනු ලැබිය හැකිය. කොටසක සම්පූර්ණ වටිනාකම එක් වාරිකයකින් වුවද ගෙවනු ලැබිය හැකිය.

(4) (අ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට වසරක් ඉක්මයාමට ප්‍රථම දකුණු පළාතේ සියළුම ලියාපදිංචි සමුපකාර සමිති එක් කොටසක අගය රුපියල් පන්සියයක් වන ලෙස අතුරු ව්‍යවස්ථා සංශෝධනය කර ක්‍රියාත්මක කළ යුතුය. එසේ වුවත් පාසල් සමුපකාර සමිති සඳහා මෙම විධිවිධානවල සඳහන් මුදල අදාළ නොවිය යුතුය.

(ආ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට සාමාජිකත්වය ලබා ඇති සාමාජිකයන්ට මෙම විධිවිධාන බල නොපැවැත්විය යුතුය.

(ඇ) තවද කොටස් මුදල සම්පූර්ණ කළ දින සිට එක් වසරක් ඉකුත් වන තෙක් ඡන්දය දීමේ අයිතිය හෝ ධූර දැරීමේ අයිතිය සාමාජිකයෙකු විසින් භුක්ති විඳිනු නොලැබිය යුතුය.එහෙත් ඉහත එක් වර්ෂයක කාලසීමාව අළුතින් ලියාපදිංචි කිරීමට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ නම සඳහන් පුද්ගලයන්ට හා ලියාපදිංචි සමුපකාර සමිති සාමාජික වන සමිතිවලට මෙය බල නොපැවැත් විය යුතුය.

(5) පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව පමණක් ලියාපදිංචි සමිතියක ඕනෑම රැස්වීමකදී ඡන්දය දීමට සහ නිලයකට තෝරා පත් කරනු ලැබීමට සාමාජිකයෙකුට හිමිකම් තිබිය යුතුය.

(6) (අ) පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක, මහ නගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරයෙකු, සභිකයෙකු වන කිසිම තැනැත්තෙකු හෝ ලියාපදිංචි කළ සමුපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ තවදුරටත් එලෙස

ධුරයේ කටයුතු කිරීමට සුදුස්සෙකු නොවිය යුතුය. තවද කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරන ලද හොත් මිස දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු දකුණු පළාතේ සමුපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් තෝරාපත් කරගනු ලැබීමට හෝ ධුරයක කටයුතු කරනු ලැබීමට සුදුස්සෙකු නොවිය යුතුය. එසේ වුවද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගෙන් පමණක් සමන්විත වන ලියාපදිංචි සමුපකාර සමිතියක ධුරයක් සඳහා මෙම වගන්තිය බල නොපැවැත්විය යුතුය.

(ආ) කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරන ලද හොත් මිස දකුණු පළාතේ සමුපකාර සමිතියක සේවකයෙකු සමුපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත්කර ගනු ලැබීමට හෝ ධුරයේ කටයුතු කිරීමට සුදුස්සෙක් නොවිය යුතුය. එසේ වුවද සමුපකාර සමිතියක සේවකයින්ගෙන් පමණක් සමන්විත සමුපකාර සමිතියක ධුරයක් දැරීමට මෙම වගන්තිය බල නොපැවැත්විය යුතුය.

(7) කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරනු ලබන අවස්ථාවකදී හැර යම් තැනැත්තෙක් තෝරාපත් කර ගන්නා දිනයේ දී සාමාජිකත්වය ලියාපදිංචි සමිතිවලින් සමන්විත වන වෙනත් යම් ලියාපදිංචි සමිතියක සභාපතිව සිටින්නේ නම් ඒ තැනැත්තා සාමාජිකත්වය ලියාපදිංචි සමිතිවලින් සමන්විත වන පළමු සඳහන් සමිතියේ පරමාර්ථවලට සමාන නොවන පරමාර්ථ ඇත්තා වූ ලියාපදිංචි සමිතියක සභාපති ලෙස තෝරාපත් කර ගනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය. එතකදු වුවත් දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයකට සභාපති වශයෙන් තෝරාපත් කර ගැනීමේ දී ඉහත විධිවිධාන අදාළ නොවිය යුතුය.

*ආශ්‍රිත සාමාජිකයෝ*

12. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් සමිතියේ අතුරු ව්‍යවස්ථාවල අනුකූල ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ගිවිසුමකට එළඹෙන කවර හෝ පුද්ගලයෙකු ආශ්‍රිත සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගත හැකිය. එහෙත් එම ගිවිසුම සමුපකාර සමිතියේ ව්‍යාපාරික කටයුතුවලට වාසිදායක විය යුතුය.

(2) ආශ්‍රිත සාමාජිකයෙකුට සමිතියේ වත්කම්වල හෝ ලාභවල කවර ආකාරයේවූ හෝ කොටසකට හෝ සමිතියේ කටයුතු කරගෙන යාමෙහිලා යම් ඡන්ද බලයකට හිමිකම් නොලැබිය යුතුය.

(3) මේ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර ආශ්‍රිත සාමාජිකයෙකුට සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සාමාජිකයෙකුගේ වරප්‍රසාද හා අයිතිවාසිකම් තිබිය යුතු අතර සාමාජිකයෙකුගේ යම් වගකීම්වලට ඔහු යටත් විය යුතුය.

*බාලවයස්කරුවන් වන සාමාජිකයන් විසින් සමිති සමග ඇතිකර ගනු ලබන ගිවිසුම හා ගණුදෙනු.*

13. ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලැබූ යම් තැනැත්තෙකුගේ බාල වයස හෝ ඔහු නිසි වයසට නොපැමිණීම, මේ ප්‍රඥප්තිය යටතේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති යටතේ ඔහු විසින් ලියා අත්සන් කරනු ලැබීම අවශ්‍ය නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කිරීම හෝ දෙනු ලැබීම අවශ්‍ය නිදහස් කිරීමක් දීමට ඔහුට බාධාවක් නොවිය යුතුය. තවද එවැනි යම් තැනැත්තෙකු විසින් සමිතියක් සමග ඇති කර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම සඳහා හෝ මගහරිනු පිණිස ඒ කරුණ හේතුවක් නොවිය යුතුය. එමෙන්ම එවැනි යම් තැනැත්තෙකු විසින් ප්‍රධාන පාර්ශවකරු හෝ ඇපකරු වශයෙන් සමිතියක් සමග ඇති කර ගත් එවැනි යම් ගිවිසුමක්, ඔහුගේ බාල වයස හෝ නිසි වයසට නොපැමිණීම නොතකා ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව නීතිය අනුව ක්‍රියාත්මක කළ හැකි විය යුතුය.

*සමිතිවල නිලධරයන් විසින් ඇතිකර ගනු ලබන ගිවිසුම්.*

14. ලියාපදිංචි කළ සමිතියක යම් නිලධරයෙකු පත් කිරීමෙහිලා වූ යම් දෝෂයක් හෝ ඔහු තෝරාපත් කර ගැනීම සඳහා වූ යම් නුසුදුසුකමක් තදනන්තරව සොයා ගැනීම, ඒ සමිතිය වෙනුවෙන් ඒ නිලධරයා විසින් ඇතිකර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම හෝ මගහැරවීම සඳහා හේතුවක් නොවිය යුතුය.

*සාමාජිකයන්ගේ ඡන්ද.*

15. යම් සමිතියක මහා සභාවක, කාරක සභාවක සාමාජිකයෙකුට සමිතියේ කටයුතු පවත්වා ගෙන යාමෙහි ලා එක් ඡන්දයක් පමණක් තිබිය යුතුය. එසේ වුවද ඡන්ද සම සමව බෙදුන හොත් සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතුය.

එතකුදු වුවත් කාරක සභිකයන් හෝ නිලධාරින් තෝරාගන්නා අවස්ථාවකදී ඡන්ද සමසමව බෙදුනහොත් කුසපත් ඇදීමකින් සුදුසු අයෙකු තෝරාගත යුතුය.

16. (1) යම් මූලික සමිතියක සාමාජිකයෙකු විසින් ඒ සමිතියේ යම් රැස්වීමක දී පෞද්ගලිකවම හැර තම ඡන්දය පාවිච්චි නොකළ යුතු ය. ඡන්ද පාවිච්චි කරන ක්‍රමය

එසේ වුව ද නියෝජිතයන් මාර්ගයෙන් ඡන්දය දීමට සමිතියේ අතුරු ව්‍යවස්ථාව යටතේ විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක සමිතියේ යම් රැස්වීමක දී එසේ ඡන්දය දීමට ඉඩදිය හැකි ය.

(2) වෙනයම් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු වන ලියාපදිංචි කළ සමිතියක් විසින්, ඒ වෙන යම් ලියාපදිංචි කළ සමිතියේ කටයුතු පවත්වාගෙන යාමෙහිලා ඡන්දය දීමේ කාර්යය සඳහා ස්වකීය සාමාජිකයන්ගෙන් කෙනෙකු පත්කළ හැකි ය.

17. (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකුගේ හෝ සිටිය සාමාජිකයෙකුගේ හෝ මියගිය සාමාජිකයෙකුගේ හෝ ප්‍රාග්ධනයෙහි කොටස් හෝ වෙනත් සම්බන්ධතා පැවරීම, සතුව සිටිය හැකි වැඩිම ප්‍රමාණය සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියෙන් හෝ රීතිවලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් විය යුතුය. කොටස් හෝ සම්බන්ධතා පැවරීම පිළිබඳ සීමා.

(2) සීමාරහිත වගකීම්වලින් යුත් ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට කිසිම සාමාජිකයෙකු විසින් -

(අ) තමා විසින් යම් කොටසක් හෝ සම්බන්ධතාවක් එක් අවුරුද්දකට නොඅඩු කාලයක් දරන ලද්දේ නම්, හා

(ආ) සමිතිය වෙත හෝ සමිතියේ සාමාජිකයෙකු වෙත හෝ සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම්පත්‍රය කාරක සභාව විසින් පිළිගනු ලැබ සිටින තැනැත්තෙකු වෙත පැවරීම කරනු ලබන්නේ නම් මිස තමා විසින් දරනු ලබන සමිතියේ ප්‍රාග්ධනයේ යම් කොටසක් හෝ සම්බන්ධතාවක් හෝ එහි යම් කොටසක් නොපැවරිය යුතු ය.

## *3 වන පරිච්ඡේදය*

## **ලියාපදිංචි කළ සමිතිවල යුතුකම්**

18. මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට දැන්වීම් හා ලිපිය වනු ලැබිය හැකි, රීති අනුව ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයක් සෑම ලියාපදිංචි කළ සමිතියකම තිබිය යුතු අතර, ඒ ලිපිනය සම්බන්ධයෙන් යම් වෙනසක් ඇති වීමෙන් පසු දින හතක් ඇතුළත ඒ වෙනස රෙජිස්ට්‍රාර් වෙත දැන්විය යුතු ය. සමිතියේ ලිපිනය.

19. ලියාපදිංචි කළ සෑම සමිතියක්ම විසින් මේ ප්‍රඥප්තිය සහ රීතිවල හා සමිතියේ අතුරු ව්‍යවස්ථාවල පිටපත් ද, කාරක නියෝගවල පිටපතක් ද සමිතියේ සාමාජිකයන්ගේ නාම ලේඛනයක් ද අවසන් විගණන වාර්තාව ද සාමාජිකයෙකු විසින් ඉල්ලා සිටින විටක යුක්ති සහගත වේලාවක් තුළ දී ගාස්තු ගෙවීමක් නොමැතිව පරීක්ෂාකර බැලීම සඳහා සමිතියේ ලියාපදිංචි කරන ලද ලිපිනය දරන ස්ථානයෙහි තැබිය යුතු ය. ප්‍රඥප්තිය රීති අතුරු ව්‍යවස්ථා යනාදියෙහි පිටපතක් ද පරීක්ෂා කර බැලීමට විවෘතව තිබිය යුතු බව.

## *4 වන පරිච්ඡේදය*

## **ලියාපදිංචි කළ සමිතිවල අයිතිවාසිකම්, බැදීම් හා වරප්‍රසාද**

20. සමිතියක් ලියාපදිංචි කිරීම හේතු කොටගෙන එය ලියාපදිංචි කරනු ලැබූ නාමය යටතේ, අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති හා දේපළ සතුව සිටීමේ ද ගිවිසුම්වලට ඇතුළත්වීමේ ද නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීමේ හා පවරනු ලැබීමේ හා ඒවා සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමේද සමිතිය පිහිටුවීමේ කාර්යය සඳහා අවශ්‍ය සියළු දේවල් කිරීමේ ද බලය සහිත සංස්ථාවක් විය යුතු ය. සමිති සංස්ථා විය යුතු බව.

21. (1) කෘෂිකාර්මික හෝ සත්ත්ව පාලනමය ද්‍රව්‍ය හෝ යම් කර්මාන්තයක නිෂ්පාදනය වන යම් භාණ්ඩයක් විකිණීම එක් පරමාර්ථයක් වශයෙන් ඇති ලියාපදිංචි කළ සමිතියක් විසින්; සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීම.

(අ) එවැනි යම් දෙයක් නිෂ්පාදනය කරන සමිතියේ සෑම සාමාජිකයෙකුම විසින් ඒ ද්‍රව්‍ය සම්පූර්ණයෙන් හෝ එහි යම් නිශ්චිත කොටසක්, සාමානුපාතයක් හෝ වර්ගයක් සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් විකිණිය යුතු බවට හා

(ආ) අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුම් කඩකිරීමේ වරදට වරදකරු ලෙස රීතිවලින් නියම කළහැකි ආකාරයකින් ඔප්පු කරනු ලැබූ හෝ තීන්දු කරනු ලැබූ සාමාජිකයෙකු විසින් රීතිවලින් හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් නිශ්චය කරනු ලබන හෝ තක්සේරු කරනු ලබන මුදලක්, ප්‍රමාණ කළ අලාභය වශයෙන් සමිතියට ගෙවිය යුතු බවට,

සමිතියේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන සැලැස්වීම හෝ එහි සාමාජිකයන් සමග ගිවිසුමකට ඇතුළුවීම කළ හැකි ය.

(2) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වන උපවගන්තිය යටතේ ඇතිකරගත් ගිවිසුමකින් ඒ ගිවිසුම අදාළ වන නිෂ්පාදිත හෝ නිෂ්පාදනය කරනු ලැබීමට ආසන්න සියලු ද්‍රව්‍යයන් කෙරෙහි සමිතියේ වාසියට පළමු බැඳීමක් ඇතිවිය යුතු ය.

(3) (1) උපවගන්තිය යටතේ වූ ගිවිසුමකින් උද්ගතවන යම් නීති කෘත්‍යයක දී ඒ ගිවිසුම ව්‍යාපාර තහනමක් වශයෙන් වූ ගිවිසුමක් යන්න නිදහසට කරුණක් නොවිය යුතු ය.

(4) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකු වීමට පෙර තම ද්‍රව්‍ය වෙනයම් තැනැත්තෙකුට භාරදීමට ගිවිසගෙන සිටීමේ හේතුව කරණ කොටගෙන ඒ ද්‍රව්‍ය ඒ ලියාපදිංචි කළ සමිතියට භාරදීමට ඔහු අපොහොසත් වූයේ නම් ඒ නිෂ්පාදන ඒ සමිතියට භාරදීමට තමාට නියම කෙරෙන ඒ සමිතියේ යම් අතුරු ව්‍යවස්ථාවක් ඒ සාමාජිකයා විසින් කඩකරනු ලැබූ ලෙස නොසැලකිය යුතු ය.

(5) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා ඉල්ලුම්කරන සෑම තැනැත්තෙකු විසින්ම යම් ද්‍රව්‍යයක් වෙනයම් තැනැත්තෙකුට භාරදීම සඳහා තමා ඇතිකරගත් සියළු ගිවිසුම් පිළිබඳ විස්තර තම ඉල්ලුම් පත්‍රයෙහි එළිදරව් කරන ලෙස නියම කරනු ලැබුවහොත් එසේ කළ යුතු ය.

ඇතැම් අවස්ථාවලදී ලියාපදිංචි කළ සමිතියක් මාර්ගයෙන් නිෂ්පාදන අනිවාර්යයෙන් විකිණීම.

22. (1) ලියාපදිංචි කළ යම් සමිතියක් සම්බන්ධයෙන් වූ විට ඒ සමිතියේ සාමාජිකයන් හෝ එහි යම් කොටසක් දකුණු පළාතේ හෝ දකුණු පළාතේ යම් කොටසක, දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක යම් භාණ්ඩයක් නිපදවන්නන් බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් තමාගේ අභිමතය පරිදි නියෝගයක මාර්ගයෙන් අවස්ථාවෝචිත පරිදි දකුණු පළාතේ හෝ දකුණු පළාතේ යම් කොටසක දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක ඒ භාණ්ඩ පිළිබඳ එක් එක් නිපදවන්නාට ඒ නිපදවන්නා ඒ සමිතියේ සාමාජිකයකු වුව ද, නොවුව ද ඒ නිපදවන්නා විසින් නිෂ්පාදනය කරනු ලබන ඒ භාණ්ඩයෙහි සම්පූර්ණ ප්‍රමාණයෙන් ඔහුගේ ප්‍රයෝජනයට හෝ පරිභෝජනයට අවශ්‍ය නොවන කොටස ඒ සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් අලෙවි කරන ලෙස විධානය කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර, ඒ නියෝගයෙහි ඒ භාණ්ඩය, නියෝගය ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශය හා ඒ භාණ්ඩය නිපදවන්නාට ගෙවිය යුත්තේ කවර පදනමක් මත ද යන වග නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(3) සෑම නියෝගයක්ම ඒ *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මකවිය යුතු අතර, (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව එය පරිච්ඡින්න කරනු ලබන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක්ම ක්‍රියාත්මක වීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා දකුණු පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන සෑම නියෝගයක්ම පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ යටතේ කළින් කරන ලද හෝ කරනු ලැබීමට ඉඩදෙන ලද කිසිවක වලංගු භාවයට හානිකර නොවිය යුතුය. නියෝගයක් පරිච්ඡින්න

කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ඒ නියෝගය අනුමත කිරීම දකුණු පළාතේ පළාත් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ දිනය විය යුතු අතර ඒ දිනය *ගැසට් පත්‍රයේ* නිවේදනය කරනු ලැබිය යුතුය.

(6) (අ) අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියෝගයකින් (ඒ නියෝගය මින් මතු සංශෝධනය කිරීමේ නියෝගය යනුවෙන් සඳහන් කරනු ලැබේ.) (1) වන උප වගන්තිය යටතේ කළින් කරන ලද යම් නියෝගයක් ඕනෑම අවස්ථාවක වෙනස් කළ හැකිය. සෑම සංශෝධනය කිරීමේ නියෝගයක්ම එය *ගැසට් පත්‍රයෙහි* පළකළ දින සිට ක්‍රියාත්මක විය යුතුය.

(ආ) සංශෝධනය කිරීමේ නියෝගයකින් වෙනස් කරනු ලබන (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගයක් එසේ වෙනස් නොකරන ලද්දේ නම් ක්‍රියාත්මක විය හැකිව තිබූ කාල පරිච්ඡේදය තුළ එසේ වෙනස් කරනු ලැබූ පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු අතර ඊට වැඩි කාලයක් ක්‍රියාත්මක නොවිය යුතුය.

(ඇ) සෑම සංශෝධනය කිරීමේ නියෝගයක්ම අනුමැතිය සඳහා දකුණු පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද (1) වන උප වගන්තිය යටතේ කරනු ලබන නියෝගයක් (4) වන උප වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබීමට පෙර සංශෝධනය කිරීමේ නියෝගයක් හෝ නියෝග වැඩි ගණනකින් වෙනස් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියෝගය ඒ උපවගන්තිය යටතේ අනුමැතිය සඳහා දකුණු පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ විට ඒ සංශෝධනය කිරීමේ නියෝගයෙන් හෝ නියෝගවලින් ඇති කරන ලද සියළු වෙනස් කිරීම් එහි අන්තර්ගත කරනු ලැබිය යුතු අතර, එවැනි යම් අවස්ථාවකදී එවැනි සංශෝධනය කිරීමේ නියෝගයක් වෙන් වෙන් වශයෙන් දකුණු පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

(ඈ) අනුමැතිය සඳහා දකුණු පළාතේ පළාත් සභාව ඉදිරියට ගෙන එනු ලැබූ යම් සංශෝධනය කිරීමේ නියෝගයක් පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම ඒ සංශෝධනය කිරීමේ නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබීමක් ලෙස සැලකිය යුතු අතර (1) වන උප වගන්තිය යටතේ කරනු ලැබූ නියෝග ඒ පරිච්ඡින්න කිරීමේ දිනයේ සිට ඒ සංශෝධනය කිරීමේ නියෝගය නොලැබූවාක් මෙන් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

(ඉ) (1)වන උපවගන්තිය යටතේ කළින් කරන ලද යම් නියෝගයක් අමාත්‍යවරයා විසින් යම් විටෙක පරිච්චින්න කළ හැකිය. එවැනියම් නියෝගයක් පරිච්ඡින්න කිරීමේ නියෝගය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර ඒ නියෝගය එසේ පළ කිරීමේ දින සිට පරිච්චින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය.

(7) සෑම නියෝගයක්ම දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබූ විට එය මෙහිලා පනවනු ලැබූවාක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

(8) මේ වගන්තිය යටතේ *ගැසට් පත්‍රයෙහි* පළ කිරීමට නියමිත සෑම නිවේදනයක්ම අමාත්‍යවරයාගේ අත්සන යටතේ පළකළ යුතුය.

(9) මේ වගන්තිය යටතේ කරන ලද යම් නියෝගයක විධිවිධාන අන්කිසි ලිඛිත නීතියක විධිවිධාන සමග නොගැළපීම හෝ ගැටීම නොතකා ඒ නියෝග බලපවත්නා කාල පරිච්ඡේදය තුළ ඒ අන් ලිඛිත නීතිය අභිබවා ඒ විධිවිධාන බලපැවැත්විය යුතුය.

(10) තමා සාමාජිකයෙකු නොවන ලියාපදිංචි කළ සමිතියකට හෝ සමිතියක් මාර්ගයෙන් යම් භාණ්ඩයක් විකුණන ලෙස (1) වන උපවගන්තිය යටතේ නියෝගයකින් විධිවිධාන කරනු ලැබූ සෑම නිපදවන්නෙකුම ඒ විධානය අනුව වූ එවැනි යම් විකිණීමක් සම්බන්ධයෙන් හා ඒ විකිණීමෙන් උද්ගතවන යම් කරුණක් හෝ ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඔහු ඒ සමිතියේ සාමාජිකයෙකුව සිටියේ නම් යටත් විය හැකිව තිබූ කොන්දේසි හා බැඳීම්වලටම යටත්විය යුතුය.

(11) (1) වන උපවගන්තිය යටතේ නියෝගයක් කරන ලද්දේ යම් නිපදවන්නෙකු සම්බන්ධයෙන් ද ඒ නිපදවන්නා වූ ද ලියාපදිංචි කරනු ලැබූ සමිතියේ සාමාජිකයෙකු නොවන්නා වූ ද යම් නිපදවන්නෙකු විසින් ඒ සමිතියේ සාමාජිකයෙකු ලෙස ඇතුළත්වීම සඳහා ඉල්ලුම්කරනු ලබන අවස්ථාවක සමිතිය විසින්,

(අ) ඔහු එසේ කැමති වන්නේ නම් ඔහුගේ ගිණුමට සමිතියට ලැබුණ හෝ සමිතිය විසින් දරනු ලබන යම් අරමුදල්වලින් සාමාජිකත්වය සඳහා වූ දායක මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් අය කර ගත හැක. තව ද,

(ආ) ඉහත කී පරිදි යම් අය කර ගැනීමකට යටත්ව ඒ දායක මුදල සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු ඔහු සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කළ යුතුය.

ගිවිසුම් කඩ කිරීමට අන්‍යයන් පොළඹවන තැනැත්තෝ.

23. (1) වෙනයම් තැනැත්තෙකු විසින් නිෂ්පාදනය කරනු ලබන යම් භාණ්ඩයක් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඒ සමිතිය මාර්ගයෙන් විකිණීමට ඒ වෙනත් තැනැත්තා 21 වන වගන්තිය යටතේ ගිවිසගෙන සිටින හෝ 22 වන වගන්තිය යටතේ වූ නියෝගයකින් බැඳී සිටින බව දැන සිටියදී හෝ ඒ පිළිබඳව දැන්වීමක් ලැබ ඇතිව සිටියදී අවස්ථාවෝචිත පරිදි ඒ ගිවිසුම කඩකරමින් හෝ ඒ නියෝගයට පටහැනිව ඒ භාණ්ඩය විකිණීමට හෝ භාරදීමට ඒ වෙනත් තැනැත්තා පොළඹවන හෝ කැමති කරවා ගන්නා යම් තැනැත්තෙකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(2) (1)වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක ඒ වරද කරන විට ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හෝ නිලධරයෙකුව සිටි සෑම තැනැත්තෙකුම ඒ වරද සිදුකරන ලද්දේ තමා නොදැනුවත්ව හෝ ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා නිසි සියළු උද්යෝගයෙන් තමා ක්‍රියාකළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

සාමාජිකයෙකු මියගිය විට සම්බන්ධතා පැවරීම.

24. (1) සාමාජිකයෙකු මියගිය පසු ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා ඒ වෙනුවෙන් සාදනු ලැබූ රීති අනුව නම් කරනු ලැබූ තැනැත්තෙකුට හෝ එසේ නම් කරනු ලැබූ කිසිම තැනැත්තෙකු නොසිටි නම් මියගිය සාමාජිකයාගේ නීත්‍යානුකූල උරුමකරු හෝ නියෝජිතයා ලෙස කාරක සභාවට පෙනී යා හැකි වෙනයම් තැනැත්තෙකුට පැවරිය හැකිය. නැතහොත් රීති හෝ අතුරු ව්‍යවස්ථාව අනුව නිශ්චය කරනු ලැබූ ඒ සාමාජිකයාගේ කොටසේ හෝ වෙනත් සම්බන්ධතාවේ වටිනාකමට සමාන මුදලක් ඒ නම් කළ තැනැත්තාට උරුමකරුට හෝ නීත්‍යානුකූල නියෝජිතයාට ගෙවිය හැකිය.

එසේ වුව ද,

(අ) සීමාරහිත වගකීම්වලින් යුතු සමිතියක් සම්බන්ධයෙන් වූ විට අවස්ථාවෝචිත පරිදි ඒ නම් කරනු ලැබූ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා විසින් මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතාව සම්බන්ධයෙන් ඉහත කී පරිදි නිශ්චය කරනු ලැබූ වටිනාකම සමිතිය විසින් ගෙවන ලෙස ඉල්ලා සිටිය හැකිය.

(ආ) සීමාසහිත වගකීම්වලින් යුතු සමිතියක් සම්බන්ධයෙන් වූ විට සමිතිය විසින් මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා සමිතියේ සාමාජිකත්වය සඳහා රීති හා අතුරු ව්‍යවස්ථාව අනුව සුදුසුකම්ලත් අවස්ථාවෝචිත පරිදි ඒ නම්කළ තැනැත්තා උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත හෝ මියගිය තැනැත්තාගේ මරණයෙන් පසු හය මසක් ඇතුළත ඔහු විසින් කරනු ලබන ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබූ එසේ සුදුසුකම්ලත් වෙනයම් තැනැත්තෙකු වෙත පැවරිය හැක.

(2) ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ සමිතියේ මියගිය සාමාජිකයාට ගෙවිය යුතු වෙනත් සියළු මුදල් අවස්ථාවෝචිත පරිදි එසේ නම් කළ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත ගෙවිය යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ වගන්තියේ විධිවිධාන අනුව කරන ලද සියලු පැවරීම් හා ගෙවීම් වෙන යම් තැනැත්තෙකු විසින් සමිතියට ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමකට විරුද්ධව වලංගු හා බල සහිත විය යුතුය.

25. (1) (අ) සෑම ලියාපදිංචි කළ සමිතියකම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පනවනු ලබන හා පනවනු ලදැයි සලකන රීති හා සමිතියේ අතුරු ව්‍යවස්ථාවල නියමකර ඇති පරිදි සාමාජික නාම ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාම කාරක සභාවේ වගකීම වන්නේ ය. සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු බව.

(ආ) එම ලේඛනය පහත සඳහන් කරුණුවලින් සමන්විත විය යුතුය.

(i) සාමාජිකයාගේ සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය, රක්ෂාව, ඔහුට අයත් කොටස් ගණන,

(ii) සාමාජිකයාගේ අත්සන හෝ මාපට ඇඟිලි සළකුණ,

(iii) එම සාමාජිකයා විසින් නම් කරනු ලබන තැනැත්තන් වෙතොත් සම්පූර්ණ නම, ලිපිනය, උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය.

(2) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වා ගෙන යනු ලබන සාමාජිකයන්ගේ යම් නාමලේඛනයක් හෝ ලැයිස්තුවක් එහි සටහන් කරන ලද පහත සඳහන් විස්තරවලින් යම් විස්තරයක් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි විය යුතු ය.

(අ) සාමාජිකයෙකු වශයෙන් යම් තැනැත්තෙකුගේ නම, එම නාමලේඛනයෙහි හෝ ලැයිස්තුවෙහි සටහන් කරන ලද දිනය,

(ආ) එබඳු යම් තැනැත්තෙකු සාමාජිකත්වය ලබාගත් දිනය,

(ඇ) එබඳු යම් තැනැත්තෙකු සාමාජිකයෙකුව සිටීම නතර කළ දිනය.

(3) (අ) ඉහත සඳහන් පරිදි සකස් කරන ලද සාමාජික නාමලේඛනයේ සහතික කළ පිටපතක් මෙම ප්‍රඥප්තිය සම්මත වී මාස තුනක් තුළ ද,

(ආ) සෑම ලිත් වර්ෂයක් ආරම්භ වී මාස තුනක් ඇතුළත ඉකුත් වර්ෂය තුළ සාමාජික නාම ලේඛනයේ සිදු කරන ලද ඇතුළත් කිරීම්, ඉවත් කිරීම් ඇතුළු සියලු සංශෝධනයන්ද, කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කිරීම කාරක සභාව වෙනුවෙන් සභාපතිගේ වගකීම වන්නේය.

26. (1) ලියාපදිංචි කළ සමිතියක් ගනුදෙනු කිරීමේ දී විධිමත් ලෙස තබන ලද පොතක වූ යම් සටහනක පිටපතක් රීතිවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහතික කරනු ලැබුවේ නම් ඒ සටහන පැවැති බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් ලෙස යම් සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක දී පිළිගත යුතු ය. තව ද, ඒ මුල් සටහන පිළිගනු ලබන සෑම අවස්ථාවක දීම හා පිළිගනු ලබන ප්‍රමාණයකට ඒ පිටපතෙහි සටහන් කරන ලද කරුණු ගණුදෙනු හා ගණන් පිළිබඳ සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතුය. සමිතියේ පොත්පත්වල සටහන් ඔප්පු කිරීම.

(2) ලියාපදිංචි කළ සමිතියක් පාර්ශවකරුවකු නොවන යම් නීති කෘත්‍යයක දී (1) වන උපවගන්තිය යටතේ ඔප්පු කළ හැකි කරුණු අඩංගු සමිතියේ පොත්පත් ඉදිරිපත් කරන ලෙස හෝ එහි සටහන් කරන ලද යම් කරුණු, ගනුදෙනු හෝ ගණන් ඔප්පු කිරීම පිණිස සාක්ෂිකරුවෙකු වශයෙන් පෙනී සිටින ලෙස, අධිකරණය විසින් විශේෂ හේතු කරණ කොටගෙන එසේ කිරීමට විධානය කරතහොත් මිස, ඒ සමිතියේ කිසිම නිලධරයෙකුට බලනොකළ යුතුය.

27. තත්කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතියක් හෝ වෙනත් නීතියක් නොතකා, ලියාපදිංචි කළ සමිතියක් විසින් සමිතියක් විසින් ඔඩපන වශයෙන් සුරැකුම්පත්.

(අ) සාමාන්‍ය ගිණුම් තුලනයක් සඳහා ඇපය වශයෙන් ඒ සමිතිය සතු යම් සුරැකුම්පත් ඔඩපනය කළ හැකි ය, තව ද

(ආ) සමිතිය වෙත නිකුත් කරනු ලැබූ දැන්වීමක් අවසන් වන දිනයෙහි මුදල් ගෙවීම නොකරන ලද්දේ නම් අධිකරණය වෙත නොගොස් සුරැකුම්පත්වලින් යමක් හෝ සියල්ලම විකුණා එයින් ලැබෙන ඒ ගිණුම් තුලනයට බැර කරන ලෙස ණය හිමියාට බලය පැවරිය හැකි ය.

දේපළ අත්කර ගැනීම.

28. ලියාපදිංචි කළ සමිතියක් විසින් එහි පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයන් සඳහා ඉඩම්, ගොඩනැගිලි හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීමෙන්, ඉදිකිරීමෙන්, තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීම හා බද්දට ගැනීම හෝ විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම කළ හැකිය.

එසේ වුව ද, ලියාපදිංචි කළ සමිතියකට වෙළෙඳ බඩු තොග හැර කිසිදු චංචල දේපළක වටිනාකම රුපියල් දෙලක්ෂයක් ඉක්මවන විට මහා සභාවේ අනුමැතිය නොමැතිව ද රුපියල් ලක්ෂ පහ ඉක්මවන විට මහා සභාවේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා නොගෙනද ඉහත සඳහන් ආකාරයකින් යම් ආකාරයකට අත්කර ගැනීම කළ නොහැකිය.

ඉහත සඳහන් ආකාරයකින් යම් ආකාරයකට නිශ්චල දේපළ අත්පත්කර ගැනීමේදී හා බැහැර කිරීමේදී සමිතියේ මහා සභාවේ මෙන්ම රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතුය.

ඉඩම් හා ගොඩනැගිලි අනිවාර්යෙන්ම අත්කර ගැනීම.

29. (1) ලියාපදිංචි කළ සමිතියක පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයන් සඳහා යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අවශ්‍යවන අවස්ථාවක ඒ කාර්යය පොදු කාර්යයන් ලෙස සලකනු ලැබිය යුතු අතර රජය විසින් ඒ සමිතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල අත්කර ගත හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියක් සඳහා රජය විසින් ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගතයුතු අවස්ථාවක ඒ සමිතිය විසින් ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඒ පනතේ සඳහන් විධිවිධාන යටතේ නියෝගයක් කරනු ලැබීමට පෙර ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් ඒ පනත යටතේ නිශ්චය කරනු ලැබූ මුදල හා අත්කර ගැනීමේ කටයුතුවලදී රජය විසින් දරනු ලබන යම් වියදම් අදාළ සමුපකාර සමිතිය විසින් රජයට ගෙවිය යුතුය.

එසේ වුව ද, ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කිරීමට පෙර යම් හදිසි කාර්යයක් හේතුකොටගෙන යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගැනීමට අවශ්‍යවන අවස්ථාවක ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් නිශ්චය කරනු ලැබිය හැකි යැයි අත්කර ගැනීමේ නිලධාරියා අදහස් කරන යම් මුදලක් ඒ නියෝගය කිරීමට පෙර ඒ සමිතිය විසින් රජයට ගෙවිය යුතු අතර ඉතුරු මුදලක් ඇතොත් ඒ ඉතුරු මුදල් ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කරනු ලැබීමෙන් පසු ගෙවිය යුතුය.

*5 වන පරිච්ඡේදය*

**අතුරු ව්‍යවස්ථාවලට අදාළ සාමාන්‍ය විධිවිධාන**

සමිතියක අතුරු ව්‍යවස්ථාවලින් සාමාජිකයන් බැඳෙන බව.

30. (1) ලියාපදිංචි කළ සමිතියක සෑම අතුරු ව්‍යවස්ථාවකින්ම, එම අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ඒ සමිතියේ එක් එක් සාමාජිකයා විසින් එම අතුරු ව්‍යවස්ථාව අත්සන් කරන ලද්දේ නම් හා ඒ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිපැදීමට එක් එක් සාමාජිකයා දුන් පොරොන්දුවක් එම අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් වූවේ නම් කෙරෙන ප්‍රමාණයට ම එම සමිතිය ද එහි සාමාජිකයන් ද බැඳී සිටිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථාවක අර්ථ නිරූපණය සම්බන්ධයෙන් පැන නගින යම් ආරවුලක් තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමුකළ යුතු අතර ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය නීත්‍යානුකූල අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

ව්‍යාපාර තහනම් කරන අතුරු ව්‍යවස්ථා බැඳෙන බලය.

31. අතුරු ව්‍යවස්ථා සෑදීමට යම් රීතියකින් බලය පැවරුණු යම් කරුණක් සම්බන්ධයෙන් ලියාපදිංචි කළ සමිතියක් විසින් සාදන ලද කිසිම අතුරු ව්‍යවස්ථාවක්, ඒ ව්‍යාපාර තහනම් කිරීමේ ගිවිසුමක්ය යන හේතුව පිට පමණක් කිසිම අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

32. ලියාපදිංචි කළ සමිතියක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවලින් සමිතියේ අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් එහි සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා රීතිවලට යටත්ව විධිවිධාන සැලැස්විය හැකිය. එසේ වුවද, *සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය.*

(අ) සමිතිය විසින් ඒ දඩය නියම කිරීමට අදහස් කරන බව හා ඊට හේතු ඔහු වෙත ලියවිල්ලකින් දැනුම් දී ඇත්නම් මිස හා

(ආ) රීතිවලින් නියම කරනු ලැබිය හැකි කාලයක් තුළ හා ආකාරයකින් ඒ දඩය නියම කිරීමට විරුද්ධව ප්‍රමාණවත් හේතු දැක්වීමට ඔහු අපොහොසත් වී ඇත්නම් මිස,

කිසිම සාමාජිකයෙකුට ඒ දඩය නියම නොකළ යුතුය.

## *6 වන පරිච්ඡේදය*

## ලියාපදිංචි කළ සමිතිවල දේපළ හා අරමුදල්

33. (1) ලියාපදිංචි කළ සමිතියක සෑම අතුරු ව්‍යවස්ථාවකින් ම එම අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ඒ සමිතියේ එක් එක් සාමාජිකයා විසින් එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිපැදීමට එක් එක් සාමාජිකයා දුන් පොරොන්දුවක් එම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් වූයේ නම්, කෙරෙන ප්‍රමාණයට සමිතියද එහි සාමාජිකයන්ද බැඳී සිටිය යුතුයි. *ලියාපදිංචි කළ සමිතිවලින් දෙනු ලබන ණය.*

(2) ආශ්‍රිත සාමාජිකයෙකු සමඟ ඇති කර ගන්නා ගිවිසුමකින් ණයට ද්‍රව්‍ය සැපයිය හැකිය.

(3) සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් පනවා ඇති විධිවිධානවලට යටත්ව එකී සාමාජිකයාගේ නිශ්චල දේපළක් ඇපයට තබා ගෙන සාමාජිකයන්ට ණය දිය හැකිය.

(4) සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් පනවා ඇති විධිවිධානවලට යටත්ව යම් චංචල දේපළක් හෝ නිශ්චල දේපළක් සමඟ පුද්ගල ඇප දෙකක් තබාගෙන සාමාජිකයන්ට ණය දිය හැකිය.

34. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් රීතිවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයට හා එසේ නියම කරනු ලැබිය හැකි කොන්දේසි යටතේ පමණක් සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් තැන්පතු හා ණය මුදල් භාර ගත හැකිය. *ලියාපදිංචි කළ සමිති විසින් භාරගනු ලබන තැන්පතු හා ණය මුදල්.*

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් නිශ්චල හෝ චංචල දේපළක උකස පිට බැංකුවක් විසින් ණය මුදලක් දෙන ලද අවස්ථාවක, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයට පෙර එම අඥාපනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද්දා වූද එම දේපළට බලපාන්නා වූද උකසක් හෝ එසේ ලියාපදිංචි ලද උකසකින් ආරක්ෂිත එසේ බලපාන්නා වූ ගෙවීමට බැඳී සිටීමක් හැර එම දේපළට බලපාන්නා වූද ඒලියාපදිංචි කරන ලද සමිතියේ කවර වූ හෝ අන් සෑම ණයකට හෝ එසේ බලපාන්නා වූ සෑම උකසකට හෝ ගෙවීමට බැඳී සිටීමකට ඉහළින් ප්‍රමුඛත්වය ඇතිව, ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයෙහි සිට හා ඉන් පසු ඒ උකස යටතේ වූ මුදල් ගෙවීමට ඒ දේපළ බැඳී තිබිය යුතුය.

35. ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයන් නොවන තැනැත්තන් සමඟ කරනු ලබන ගනුදෙණු මෙම ප්‍රඥප්තියේ 33 හා 34 වන වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි හැර රීතිවලින් නියම කරනු ලැබිය හැකි තහනම් හා සීමා කිරීම්වලට යටත් විය යුතුය. *සාමාජිකයන් නොවන තැනැත්තන් සමග කරනු ලබන වෙනත් ගනුදෙණු සීමා කිරීම.*

36. (1) (අ) ලියාපදිංචි කළ සමිතියක් විසින්, භාර ආඥා පනතේ 20 වන වගන්තියේ නිශ්චිතව සඳහන් දේපළක් පිළිබඳ පළමු උකසක් නොවන යම් සුරකුම්පත්වල හෝ යම් බැංකුකරුවෙකු සමඟ හෝ රෙජිස්ට්‍රාර් විසින් මේ කාර්යය සඳහා අනුමත කරන ලද බැංකුකරුවකු වශයෙන් ක්‍රියාකරන යම් තැනැත්තකු සමඟ, හෝ රෙජිස්ට්‍රාර් විසින් මේ කාර්යය සඳහා අනුමත කරන ලද වෙන යම් ලියාපදිංචි කළ සමිතියක කොටස්වල හෝ ඇපය පිට හෝ රීතිවලින් අවසරදෙන ලද වෙන යම් ආකාරයකින් සමිතියේ අරමුදල් තැන්පත් කිරීම හෝ ආයෝජනය කිරීම කළ හැකිය. *සමිතියේ අරමුදල් ආයෝජනය කිරීම.*

(ආ) සාමාජික හා සාමාජික නොවන අයගෙන් ලබාගන්නා තැන්පත් හා දේපළ ප්‍රති ආයෝජනය කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන ප්‍රමිතීන් අනුව සිදු කළ යුතුය.

(ඇ) සමිතිය විසින් බාහිර ආයතනවලින් තැන්පත්වලට එරෙහිව හා දේපළ සුරැකුම් මත ණය හෝ අත්තිකාරම් ලබා ගැනීමේදී රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

(ඈ) මෙම පනත යටතේ ලියාලදිංචි කරන ලද යම් සමිතියක් විසින් තම මුදල්, වෙනත් ව්‍යාපාර කටයුත්තක ආයෝජනය කිරීම රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතුය.

(2) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මකව තිබුණේ නම් අවලංගු විය හැකිව තිබූ මේ ප්‍රඥප්තිය ආරම්භ වීමට පෙර කරන ලද යම් තැන්පතුවක් හෝ ආයෝජනයක් මෙයින් වලංගු වන අතර එසේ වුවද ගිවිසුම්ගත කාල සීමාව ඉක්මවීමෙන් පසු මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන් අනුව කටයුතු කළ යුතුය.

ලාභ පිළිබඳ සුදුස්සක් කිරීම.

37. (1) ලියාපදිංචි කළ සෑම සමිතියක් විසින් ම මෙම ප්‍රඥප්තියේ 39 වන වගන්තිය යටතේ විගණක විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් මුදල් වර්ෂයක් තුළ එහි;

(අ) (i) විසර්ජනයට පෙර ලැබෙන ලාභයෙන් සියයට පහකට නොඅඩු මුදලක් මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන දකුණු පළාතේ සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුමට ගෙවිය යුතුය. විගණන වාර්තාව සමිතිය වෙත ලැබූ දින සිට දින අනුවක් නොඉක්මවන කාලයක් ඇතුළත අරමුදල් ගිණුමට ගෙවිය යුතුය. ඒ අනුව ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක මුදල් අයකර ගැනීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත සහතිකයක් නිකුත් කළ යුතුය. එසේ අයකළ යුතු මුදල දඩයක් වශයෙන් අයකර ගෙන සමුපකාර අරමුදලට බැර කිරීමට මහෙස්ත්‍රාත්වරයාට බලය ඇති වන්නේය.

(ii) මෙම (i) වන වගන්තිය යටතේ යම් නීති කෘත්‍යවලදී රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකයෙහි වූ යම් ප්‍රකාශයක නිවැරදි භාවය සලකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳ තීරණය කිරීමට යම් මහෙස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නැතහොත් නියම නොවිය යුතුය.

(ආ) ශුද්ධ ලාභවලින් සියයට විසිපහකට නොඅඩු යම් මුදලක් සමිතියේ ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කළ යුතුය. එමෙන්ම,

(ඇ) යම් සමුපකාර සමිතියක් පාඩු ලැබුවද අවම වශයෙන් රුපියල් පනහක් සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුමට ගෙවිය යුතුය. එතකුදු වුවත් පාසල් සමුපකාර සමිතිවලට මෙය බල නොපැවැත්විය යුතුය.

(ඈ) සමුපකාර සංවර්ධන අරමුදල ගිණුම පාලනය කිරීම සඳහා රීති මගින් විධිවිධාන සැලැස්විය යුතුය.

(2) (i) සමුපකාර අරමුදලට හා ව්‍යවස්ථාපිත සංචිතවලට වෙන් කිරීමෙන් පසු ඉතිරි ලාභය සමිතියේ මහා සභාවේ හා රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව පහත සඳහන් කාර්යයන් සියල්ලම හෝ ඉන් යමක් සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය හැකියඃ

(අ) ඉතිරි ලාභයෙන් සියයට දහයක් හෝ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනයෙන් සියයට දහය නොඉක්මවන ප්‍රමාණය යන දෙකෙන් අඩු ප්‍රමාණය සාමාජිකයන්ට කොටස් ලාභාංශ වශයෙන් ගෙවීම,

(ආ) සාමාජිකයන් විසින් සමිතිය සමග කරන ලද ගනුදෙණුවල වටිනාකම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවල නියමිත ප්‍රමාණයට හා ආකාරයකින් ඔවුන්ට ප්‍රතිදාන ගෙවීම,

(ඇ) අතුරු ව්‍යවස්ථාවල නියම කරනු ලැබිය හැකි යම් අරමුදල්වලට ඉතිරි ලාභයෙන් සියයට දහයක උපරිමයකට යටත්ව වෙන් කිරීම,

(ඈ) සමිතියේ සේවකයන්ට ප්‍රසාද මුදල් ගෙවීම හා ඔවුන්ගේ සුභසාධක කටයුතුවලට මුදලක් ගෙවීම.

(ඉ) අතුරු ව්‍යවස්ථාවල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් අරමුදල්වලට වෙන් කිරීම.

(ඊ) යම් සාමාජීය, සංස්කෘතික හෝ විනෝද කාර්යයන් පිණිස හෝ ප්‍රාදේශීය හෝ මහජන ප්‍රයෝජනය සඳහා වූ වෙනයම් අරමුදලක් සඵල කිරීම සඳහා වැයකිරීම පිණිස පොදු සුභසාධක අරමුදලට ඉතිරි ලාභවලින් සියයට දහයකට නොවැඩි මුදලක් ගෙවීම.

(ii) (i)වන අනු වගන්තිය අනුව ඉතිරි ලාභ අරමුදල්වලට වෙන් කිරීමෙන් පසු ඉතිරිවන මුදල ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කළ යුතුය.

### *7 වන පරිච්ඡේදය*

### ගිණුම්, අයවැය, විගණනය, විභාගය, පරීක්ෂණය හා විමර්ශනය.

38. (1) සෑම ලියාපදිංචි සමිතියක්ම සමිතියේ ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන ප්‍රමිතීන්ට අනුව නිසි ගිණුම් පවත්වාගෙන යාමට සැළැස්විය යුතුය. සමිතියේ ගිණුම් හා විගණනය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරනු ලබන පරිදි සමිතියේ කටයුතුවලට අදාළ ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්ෂික අවසාන ගිණුම් හා ප්‍රකාශයන් සෑම ලියාපදිංචිකළ සමිතියක් විසින්ම සකස් කරනු ලැබිය යුතුය. ඒ ගිණුම් ප්‍රකාශය එය අදාළ මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙසේ ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා ප්‍රකාශයන් සමිතියේ සභාපති හෝ උප සභාපති සහ කාරක සභිකයන් දෙදෙනෙකු විසින් අත්සන් සහිතව සහතික කොට දිනය සඳහන් කර තිබිය යුතුය. මෙම සහතික කරන ලද ගිණුම් හා ප්‍රකාශයන් සාවද්‍ය බවට තහවුරු වන අවස්ථාවකදී දණ්ඩ නීති සංග්‍රහය යටතේ සඳහන් කූට ලේඛන පිළියෙල කිරීමේ වරදකට වරදකරු වන්නේය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ සමිතියේ කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම වරදකට වරදකරුවන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරුවෙකු කරනු ලැබූ විට අවමය රුපියල් දස දහසක් හෝ උපරිමය රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර මාස තුනක් ඇතුළත ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්ෂික අවසාන ගිණුම් හා ප්‍රකාශයන් කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීමේ නියෝගයට ද කාරක සභාව යටත් විය යුතුය. එසේ වුවද වරදක් කරනු ලැබූයේ තමාගේ අනුදැනුම නොමැතිව බව සහ ඒ වරද කිරීම වැළැක්වීමට නිසි සියලු උද්යෝගයෙන් තමා සෑම විටම ක්‍රියාකළ බව ඒ සාමාජිකයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු නොවන්නේය.

(4) ඉහත (3) වන උපවගන්තියේ නියෝගය අනුව මාස තුනක අතිරේක කාලසීමාව තුළද ගිණුම් වාර්තා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් නොවුවහොත් අදාළ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැර සුදුසු පාලක මණ්ඩලයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත් කළ යුතුයි.

(ආ) ඉහත (අ) අනු වගන්තිය යටතේ පත් කරන ලද පාලක මණ්ඩලය විසින් අදාළ මුදල් වර්ෂය අවසාන වීමට පූර්වයෙන්, පූර්ව වර්ෂයට අදාළ ගිණුම් සකස් කර රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එසේ ඉදිරිපත් කිරීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් ලබා දෙනු ලබන කාලය අවසානයේ මහා සභාව කැඳවා අදාළ ධූර කාලයේ ඉතිරි ධූර කාලය වෙනුවෙන් සුදුසු අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර ගැනීමට කටයුතු කළ යුතුයි. එසේ පත් කර ගනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා (4)(අ) අනු වගන්තිය යටතේ ඉවත් කරනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සුදුස්සන් නොවිය යුතුයි.

(ඇ) රෙජිස්ට්‍රාර්වරයා විසින් පොත්පත් ලියවූ විටත්, වාර්තා සකස්කර ගත් විටත් ඒ සඳහා රෙජිස්ට්‍රාර්වරයාට සමිතිය විසින් ගෙවන ලද සියලු වියදම් එවකට පැවති වගකිව යුතු

කාරක සභාවෙන් සාමුහිකව හා වෙන් වෙන්ව අයකර ගැනීමට සමිතිය විසින් කටයුතු කළ යුතුය.

අයවැය පිළියෙළ කිරීම.

(5) (අ) සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම ආදායම් ඉලක්ක පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් මුල්‍ය සහ මුදල් සම්පත්, මුදල් ආයෝජන, අය වැය ගත කරන ලද ලාභ අලාභ ගිණුම් ආදායම් සහ වියදම් ගිණුම් සහ ශේෂ පත්‍රය දැක්වෙන අය වැය ලේඛනයක් සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබිය යුතුය.

(ආ) ඒ අය වැය ලේඛනය අදාළවන මුදල් වර්ෂය ආරම්භවීමට පෙරාතුව වූ මාස දෙකකට කළින් එය අනුමැතිය සඳහා සමිතියේ මහා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ඇ) යම් සමිතියක මහ සභාව කැඳවීම අත්හිටුවමින් අධිකරණයක අතුරු නියෝගයක් පවතින අවස්ථාවක, සමිතියේ ලේකම් විසින් මෝසමක් මගින් අධිකරණයට කරුණු ඉදිරිපත් කර, එම සමිතියේ වාර්ෂික ඇස්තමේන්තු හා සංවර්ධන සැලැස්ම අනුමත කර ගැනීමේ කාර්යය සඳහා පමණක් සමිතියේ විශේෂ මහා සභාවක් කැඳවීමට අවසර ලබා ගත යුතුය. ඒ අනුව කොමසාරිස් විසින් සමිතියේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය.

(ඈ) එම අය වැය ලේඛනය අදාළවන මුදල් වර්ෂය ආරම්භවීමට පෙරාතුව වූ එක් මාසයකට කළින් ඒ අයවැය ලේඛනයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය.

(ඉ) එම අයවැය ලේඛනය පිළිබඳ කරනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරයද අඩංගු විය යුතු අවම තොරතුරුද රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතුය.

විගණනය.

39. (1) ලියාපදිංචි කළ සමිතියක විගණනය රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය පවරන ලද්දා වූ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරන ලද ඕනෑම සහතිකලත් ගණන් පරීක්ෂකවරයකු විසින් හෝ කළ යුතුය. මේ වගන්තියේ වන කාර්යන් සඳහා සහතිකලත් ගණන් පරීක්ෂකවරයකු වනුයේ:-

(අ) වරලත් ගණකාධිකාරිවරයකු හෝ වරලත් ගණකාධිකාරිවරුන්ගේ සමාගමක්, හෝ

(ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වාගෙන යන ගණන් පරීක්ෂකවරුන්ගේ ලේඛනයට නම ඇතුළත් වී ඇති කෙනෙක් හෝ මණ්ඩලයක්ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ විගණනයකට ඇතුළත්වන කාලය සෑමවිටම කළින් පවත්වන ලද විගණනයට ඇතුළත් වූ කාලයේ අවසාන දිනයේ සිට එවර විගණනයට පවත්වන දිනට පූර්වයෙන් අවසන් වූ මුදල් වර්ෂයේ අවසාන දින දක්වා හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් වෙනත් විධානයක් කළහොත් එසේ විධානය කරන දින තෙක් හෝ විය යුතුය.

(3) (අ) අපරාධ නඩුවක් සඳහා යම් කිසි සිද්ධියක් හෝ කරුණක් සම්බන්ධව විගණනයක් අවශ්‍ය වූ විට විශේෂ විගණනයක් කරන ලෙස 39(1)වගන්තිය ප්‍රකාරව බලය ඇති අයෙකු වෙත විධාන කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

(ආ) අපරාධ නඩුවක් සඳහා යම් කිසි විගණනයක් අවශ්‍ය වූ විට දොළොස් මසකට අධික නොවන කාලයක් ඇතුළත් වන විශේෂ විගණනයක් කරන ලෙස ගණන් පරීක්ෂකවරයකුට විධාන කිරීමට රෙජිස්ටාර්වරයාට බලය ඇත්තේය.

(4) ගණන් පරීක්ෂකවරයකු රෙජිස්ට්‍රාර්තුමා විසින් නියමකරන ආකාරයට ගණන් පරීක්ෂණ වාර්තාවක් පිටපත් දෙකකින් යුක්තව රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කළ යුතුය. වෙනත් කරුණු අතරම පහත සඳහන් කරුණු පිළිබඳ ප්‍රකාශනයක් එම වාර්තාවට ඇතුළත් කළ යුතුය. එනම්,

(අ) තමාට අවශ්‍ය සියලුම තොරතුරු හා විස්තර ලබාගත්තේද යන්න

(ආ) ගිණුම් පොත් සමිතිය විසින් කලට වේලාවට ලියා තිබේද යන්න

(ඇ) මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සමිතියේ පොත්පත්වලට

අනුකූලද යන්න.

(5) ගණන් පරීක්ෂක තැන, රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරනු ලබන සියලුම උපලේඛන හා සහතික පත්‍ර තම ගණන් පරීක්ෂණ වාර්තාවට අමුණා එවිය යුතුය. ගණන් පරීක්ෂණ තැන රෙජිස්ට්‍රාර්වරයා විසින් හඳුන්වාදෙන ලද ආකෘති ප්‍රකාශනයට අනුව ගණන් පරීක්ෂණ සහතිකයක් සමිතියේ පරික්ෂිප්ත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය.

(6) ඉහත (1) වන උපවගන්තිය යටතේ වූ විගණනයෙහි,

(අ) ලියාපදිංචි සමිතිවල වත්කම් සහ බැරකම් පිළිබඳ තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක්

(ආ) නිසි මුදල් පාලනය සහ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් අඛණ්ඩ ඇගයීමක් කිරීමට හැකි කරනු පිණිස තොරතුරු ඉදිරිපත් කිරීම සහතික කිරීමට සංවිධාන ක්‍රම, කාර්යය පටිපාටි, පොත් වාර්තා සහ වෙනත් ලේඛන නිසිලෙස සහ ප්‍රමාණවත් ලෙස සැලැසුම් කරනු ලැබ ඇත්තේ ද සහ ඒ ක්‍රම, කාර්යය පටිපාටි, පොත් වාර්තා සහ වෙනත් ලේඛන ඵලදායක ලෙස ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳ පරීක්ෂණයක්,

(ඇ) සමිතිය පවත්වාගෙන යාම මේ ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද රීති, නියෝග හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල වන්නේද, සමිතියේ කටයුතු පරිපාලනය කිරීම මේ ප්‍රඥප්තියේ නියෝගවල හෝ ඒ යටතේ සාදන ලද රීතිවල හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව කර ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂණයක්,

(ඈ) අරමුදල් උපයෝගී කිරීම කාර්යක්ෂම ලෙස සහ පිරිමැසුම් සහිතව ක්‍රියාත්මක කොට ඇත්තේද යන්න පිළිබඳව පරීක්ෂණයක්,

(ඉ) ලියාපදිංචි සමිතියකට අයත් සහ එහි පාලනය යටතේ ඇති මුදල් සහ දේපළවල ආරක්ෂාව සහතික කරනු පිණිස සතුටුදායක කාර්යය පටිපාටි සකස්කොට ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂණයක්,

(ඊ) ගිණුම්, මුදල් යෙදවීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධාන්ත කෙරෙහි නිසි අවධානය ඇතිව සැලකිල්ලට භාජනය කොට ඇති කාල සීමාව සම්බන්ධයෙන් සමිතියේ කටයුතු පිළිබඳව සත්‍ය වූ සහ නිවැරදි ගිණුම් ඉදිරිපත් කිරීම පිණිස විගණනය කරනු ලැබූ ගිණුම් සැලසුම්කොට ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂණයක් ; සහ

(උ) වෙනත් නියමිත කරුණු ඇතුළත් විය යුතුය.

(ඌ) (6)(1) වගන්තියේ සඳහන් පරීක්ෂණවල දී ඊට අදාළ කොන්දේසි, ආකෘති, ක්‍රියාපටිපාටි සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් නියම කළ යුතු අතර එසේ නියම කරනු ලබන කොන්දේසි, ආකෘති, ක්‍රියාපටිපාටිවලට අනුකූලව ඊට අදාළ වාර්තා ලබා දිය යුතුයි.

(7) ඉහත (1) වන උපවගන්තිය යටතේ විගණන කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඒ ගණන් විගණනය කිරීම පිණිස ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකුට,

(අ) රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ විගණනය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ යම් ගනුදෙනු හෝ එහි කටයුතු පිළිබඳ කළමණාකාරීත්වය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සැපයිය හැකි කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධාරියෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු සාමාජිකයෙකු හෝ වෙනයම් තැනැත්තෙකු කැඳවීමේ,

(ආ) සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදලක්, සුරැකුම් පතක් හෝ වෙනත් දේපළක් ඉදිරිපත් කරන ලෙස එය සන්තකව හෝ භාරව සිටින, කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ නිලධරයෙකුට, නියෝජිතයෙකුට, සේවකයෙකුට හෝ සාමාජිකයෙකුට හෝ වෙනයම් තැනැත්තෙකුට නියම කිරීමේ හා අවශ්‍ය අවස්ථාවක දී ඉහත පොත් පත්, ලේඛනවල හා සුරැකුම්පතක සහතික කළ පිටපතක් ලබා දෙන ලෙස නියම කිරීමේ හා,

(ඇ) ඒ විගණනයේදී තමා විසින් වංචාවක් සොයාගනු ලබන අවස්ථාවක සමිතියේ ගණන් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමේ,

(ඈ) ඒ විගණනයේදී අදාළ සමිති කාර්යාලයට හා එකී සමිතියේ සියළුම ව්‍යාපාරික ස්ථාන වලට ඇතුළුවීමේ, පරීක්ෂා කිරීමේ හා භෞතික තොග ගණන් ගැනීමේ,

බලය ඇත්තේය.

(8) රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්යය සඳහා සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සියළු පොත්, ලේඛන, ගිණුම් සහ ලියවිලි, සුරැකුම්පත් සහ අතේ ඇති මුදල් සියළු අවස්ථාවලදී ලබාගැනීමට ද, පරීක්ෂා කිරීමටද හිමිකම් තිබිය යුතුය. තව ද ඉහත කී දේ භාරව සිටින හෝ පවත්වාගෙන යන හෝ සන්තකයේ ඇතිව සිටින සෑම තැනැත්තෙකුම ඒවා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තාට ඉදිරිපත් කළ යුතුය. නැතහොත් සමිතියේ ගනුදෙණු සහ වැඩකටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ ඒ පරීක්ෂණය හෝ විගණනය කරන ඒ බලය දෙන ලද තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතුය.

(9) රෙජිස්ට්‍රාර්වරයා සහ ලියාපදිංචි කළ සමිතිය ගණන් විගණනය කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

(10) (අ) සමිතියක සංවිධානය හෝ කළමණාකාරීත්වය භාරව සිටින හෝ භාරව සිටි හෝ සමිතියක නිලධරයෙකුව සේවකයෙකුව සිටින හෝ කවර හෝ අවස්ථාවක සිටි යම් තැනැත්තෙකු විසින් මේ ප්‍රඥප්තියේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පනවනු ලැබූ රීතිවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද සමුපකාර සමිතිවලට හෝ මුදල් කාර්යය පටිපාටියට අදාළ රීතිවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පොදු විධාන කිසිවක හෝ අතුරු ව්‍යවස්ථාවල හෝ සමිතියේ කාරක රීතිවල විධිවිධානයන්ට පටහැනිව යම් ගෙවීමක් කර ඇති බව හෝ සමිතියේ යම් අරමුදල් පාවිච්චි කර ඇති බව මෙම ප්‍රඥප්තිය යටතේ වූ විගණනයක් පැවැත්වෙද්දී හෝ එය අවසානයේදී සොයා ගතහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් එවැනි සෑම ගෙවීමකටම හා එවැනි සෑම අරමුදල් පාවිච්චි කිරීමකටම ඉඩනොදිය යුතු අතර ඒ නීති විරෝධී ගෙවීම හෝ අරමුදල් පාවිච්චි කිරීම කරන හෝ කිරීමට බලය දෙන තැනැත්තාට හෝ තැනැත්තන්ට එය අධිභාර කළ යුතුය. තව ද ඒ තැනැත්තාගේ නොසැලකිල්ල හෝ විෂමාචාරය හේතු කොටගෙන දරන්නට සිදුවූ යම් ඌනතාවයක් හෝ පාඩුවක් සහ ඒ තැනැත්තා ගණන් දැක්විය යුතු වූ නමුත් එසේ ගණන් නොදක්වන ලද යම් මුදලක් ඒ තැනැත්තාගෙන් අයකර ගත යුතුය. තවද එක් එක් අවස්ථාවේදී ඒ තැනැත්තාගෙන් අයවිය යුතු මුදල සහතික කොට තම තීරණය ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත දන්වා යැවිය යුතුය.

(ආ) යම් තැනැත්තෙකුට යම් ඉඩදීමක් නොකිරීමට හෝ යම් අධිභාරයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් හෝ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු විසින් සුදුසු යැයි සිතිය හැකි යම් කරුණු සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හෝ යම් කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට ඔහු විසින් අවස්ථාවක් දිය යුතු අතර එවැනි ඉඩනොදීමක් හෝ අධිභාර කිරීමක් කරනු ලැබූවහොත් හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ තීරණය සඳහා හේතු ඉල්ලා ඔහු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ඉඩනොදීම හෝ අධිභාර කිරීම සම්බන්ධයෙන් තම තීරණයේ හේතු ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත සැපයිය යුතුය.

(ඇ) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලබන තීරණයට අනුකූලව ක්‍රියා නොකරන ලද අවස්ථාවක මෙම ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

40. (1) ලියාපදිංචි කළ සමිතියක ක්‍රියාකාරිත්වයේ යම් අඩුපාඩු මෙම ප්‍රඥප්තිය යටතේ කරන ලද විගණනයේදී හෙළිදරව් වුවහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් එහි අඩුපාඩු සමිතියේ දැනගැනීමට හා ඒ සමිතිය අන් සමිතියක සාමාජිකයෙකු නම් ඒ අන් සමිතියේ දැන ගැනීමටද සැලැස්විය හැකිය.

විගණනයේදී අණාවරණය වූ අඩුපාඩු සමිතිය වෙත දැන්වීම.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෙළිදරව් වූ අඩුපාඩු සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා නියෝගයක් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පියවරක් ඒ නියෝගයෙහි සඳහන් කාලය ඇතුළතදී ගන්නා ලෙස සමිතියට හෝ නිලධරයන්ට විධාන කෙරෙන නියෝගයක් කළ හැකිය.

(3) ඉහත (2) උප වගන්තිය අනුව මෙම නියෝග අනුව කටයුතු නොකරනු ලබන්නේ නම් මෙම ප්‍රඥප්තියේ 56(2) (අ) වගන්තියට අනුව කටයුතු කළ හැකිය.

41. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් තම මෙහෙයවීමෙන් ලියාපදිංචි සමිතියේ සංයුතිය ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකිය. තව ද කාරක සභාවේ බහුතරයකගේ ඉල්ලීම මත හෝ ලියාපදිංචි සමිතියක මහා සභා සාමාජිකයන්ගේ තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගේ ඉල්ලීම මත ලියාපදිංචි සමිතියක සංයුතිය ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වනු ලැබිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්යය සඳහා ලිඛිත නියමයක් මගින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ලියාපදිංචි සමිතියේ සංයුතිය, ක්‍රියාකාරිත්වය සහ මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට විධාන කළ හැකිය.

පූර්ව පරීක්ෂණය විභාගය හා පරීක්ෂණය.

එසේ වුවද මෙම වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විභාගයක් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විභාගයක් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විධාන කිරීමට පෙර එවැනි විභාගයක් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයක් කිරීමට ප්‍රමාණවත් කරුණු ඇත්ද යන්න පිළිබඳ සෑහීමකට පත්වීම සඳහා සුදුසු ආකාරයේ පූර්ව පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විධාන කිරීමට ද රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

(2) (1) වන උපවගන්තිය යටතේ විභාගයක් පැවැත්වීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට,

(අ) කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධරයෙකු නියෝජිතයෙකු සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ විභාග කිරීමට හෝ පරීක්ෂා කිරීමට ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ ගනුදෙණු කිසිවක් සම්බන්ධයෙන් හෝ එහි කටයුතු කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් වැදගත් තොරතුරු දිය හැකි වෙනත් යම් තැනැත්තෙකු කැඳවීමට,

(ආ) සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදලක්, සුරැකුම් පතක් හෝ වෙනත් දේපළක් ඉදිරිපත් කරන ලෙස එය සන්තකයෙහි ඇත්තාවූ හෝ භාරව සිටින්නා වූ සමිතියේ කලින් සිටි හෝ දැනට සිටින යම් නිලධරයෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකුට සමිතියේ කටයුතු වලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදල් හෝ ඇප හෝ වෙනත් දේපළ ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට, නිලධරයෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු, සාමාජිකයෙකු හෝ වෙනයම් තැනැත්තෙකුට අවශ්‍ය අවස්ථාවක දී ඉහත පොත් පත්, ලේඛන වල හා සුරැකුම් පතක සහතික කළ පිටපතක් ලබා දෙන ලෙස නියම කිරීමට,

(ඇ) තමා විසින් යොමු කරනු ලබන යම් කාරණා තීරණය කිරීම පිණිස තමා විසින් සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයකදී සමිතියේ මහා සභා රැස්වීමක් හෝ කාරක සභා රැස්වීමක් රීති අනුව කැඳවීමට,

(ඈ) ඒ විභාගය හෝ පරීක්ෂණය අතරතුර වංචාවක් හෝ අක්‍රමිකතාවක් ඇති බව විශ්වාස කිරීමට තමාට හේතු ඇති අවස්ථාවක සමිතියේ ගිණුම්පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමට සහ,

(ඉ) ඒ විභාගයේදී හෝ පරීක්ෂණයේදී අදාළ සමිති කාර්යාලයට හා එකී සමිතියේ සියලුම ව්‍යාපාරික ස්ථානවලට ඇතුළ්වීමේ, පරීක්ෂා කිරීමේ හා භෞතික තොග ගණන් ගැනීමට, බලය ඇත්තේය.

කාරක සභාව අත්හිටුවා අන්තර්කාලීන පාලක මණ්ඩලයක් පත් කිරීම.

(3) 41 වන වගන්තිය යටතේ වූ විභාගයක් හෝ පරීක්ෂණයක් නිම කිරීමට පෙර එකී විභාගය හෝ පරීක්ෂණයට අදාළව ලබාගන්නා අතුරු වාර්තාවක් තුළින් කාරක සභාව තම කාර්යයන් නිසි ආකාරයට ඉටු නොකරනු ලබන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීමට නුසුදුසු බව හෝ වෙනත් ආකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වන්නේ නම් ඒ කාරක සභාව මාස හයක කාල සීමාවක් සඳහා අත්හිටුවීමට ද සමිතියේ වැඩ කටයුතු කළමණාකරණය කිරීම සහ පරිපාලනය කිරීම පිණිස අන්තර්කාලීන පාලක මණ්ඩලයක් පත් කිරීමටද රෙජිස්ට්‍රාර්වරයාට හැකිය. එහි කාරක සභාව අත්හිටුවනු ලැබූ දින සිට මාස හයක කාල සීමාවක් ඇතුළත ඒ විභාගය හෝ පරීක්ෂණය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිම කළ යුතු අතර ඒ කාරක සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගනු ලැබිය හැකිය.

සාමාජිකත්වය, ධුරය/නිලය, රැස්වීම් නීත්‍යානුකූලභාවය පිළිබඳ පරීක්ෂණ.

(4) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක සාමාජිකයෙකු ඒ සමිතියේ ධුරයකට යථා පරිදි තෝරාපත් කර ගන්නා ලද්දේ ද යන්න සම්බන්ධයෙන් සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකු වූ හෝ නිලධරයෙකුව සිටීම නතර වුයේද යන්න සම්බන්ධයෙන් හෝ සමිතියේ යම් මහා සභා රැස්වීමක් කාරක සභා රැස්වීමක් වලංගුව පවත්වනු ලැබූයේද යන්න සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් පරීක්ෂා කිරීම හෝ ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක මාර්ගයෙන් ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තෙකු ලවා පරීක්ෂා කරවීම කළ හැකිය.

ක්ෂණික හෝ හදිසි පරීක්ෂණ.

(5) ලියාපදිංචි කළ සමුපකාර සමිතියක මූල්‍ය තත්ත්වය පිළිබඳව හෝ තොග තත්ත්වයන් පිළිබඳව හෝ භෞතිකව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුණ විටකදී හෝ ගණුදෙනු පිළිබඳව හෝ පොත්පත් පිළිබඳව හෝ ලේඛන පිළිබඳව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගුණු විටකදී පූර්ව දැනුම් දීමකින් තොරව ක්ෂණික හෝ හදිසි පරීක්ෂාවක් සඳහා තමාට හෝ නිලධාරීන් යෙදවීමට හා විධානය කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

(6) රෙජිස්ට්‍රාර්වරයා සහ මෙම ප්‍රඥප්තියේ යම් කාර්යයක් සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

පරීක්ෂණ නිලධාරීන් රජයේ නිලධාරීන් ලෙස සැලකීම.

42. මෙම ප්‍රඥප්තිය යටතේ පවත්වනු ලැබූ විගණනයකින්, විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් සහ ක්ෂණික හෝ හදිසි පරීක්ෂණයකින් පසුව කටයුතු කරගෙන යනු ලබන කාරක සභාව වෙත රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී විභාගය හෝ පරීක්ෂණයෙන් හෙළිදරව්වන කරුණු සම්බන්ධව විධානය කරනු ලබන පරිදි විධානයේ දින සිට මාස තුනක් තුළ කටයුතු කිරීමට කාරක සභාව බැඳී සිටිය යුතුය. එසේ කටයුතු කිරීම පැහැර හරින කාරක සභාවක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය.

*8 වන පරිච්ඡේදය*

**ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව විසුරුවා හැරීම හෝ කාරක සභිකයන් ඉවත් කිරීම.**

සමිතියේ කාරක සභාව විසුරුවා හැරීම.

43. (1) 41 වන වගන්තිය යටතේ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව ලියාපදිංචි සමිතියක කාරක සභාව හෝ එකී කාරක සභාවේ සාමාජිකයෙකු හෝ සාමාජිකයන් ස්වකීය කාර්යය නිසි ආකාරයෙන් ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, එම කාරක සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් හෝ එම කාරක සභාවේ සාමාජිකයෙකු හෝ සාමාජිකයන් හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් එම කාරක සභාවේ හෝ සාමාජිකයෙකුගේ හෝ සාමාජිකයන්ගේ යම් විරෝධතා ඇතොත් එම විරෝධතා දැක්වීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කාරක සභාවට හෝ ඒ කාරක සභාවේ සාමාජිකයෙකුට හෝ කාරක සභාවේ සාමාජිකයන්ට අවස්ථාවකදී මෙන් පසුව 41 වන වගන්තිය යටතේ වූ ඒ විභාගය හෝ පරීක්ෂණය රෙජිස්ට්‍රාර්වරයාගේ මෙහෙයවීමෙන් පවත්වනු ලැබුවේ නම් රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලැබූ මහා සභාවට ද, ඒ විභාගය හෝ පරීක්ෂණය කාරක සභාවේ බහුතරයක ඉල්ලීම මත හෝ සභාවේ සාමාජිකයන් තුනෙන් එකක නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීම මත පවත්වනු ලැබුවේ නම්, අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව කැඳවනු ලැබූ හෝ රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලැබූ මහා සභා රැස්වීමටද රෙජිස්ට්‍රාර්වරයා විසින් සොයා ගන්නා ලද කරුණු හා රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වාර්තා කළ යුතුය.

(අ) එකී මහා සභාව විසින්, වරද කරන ලද කාරක සභාව හෝ කාරක සභාවේ සාමාජිකයා හෝ සාමාජිකයන් එම අවස්ථාවේදීම ඉවත් කළයුතු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන පුරප්පාඩු ඉවත්කළ තැනැත්තන් නොවන අය අතුරින් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව පුරවනු ලැබිය හැකිය.

(ආ) ඉහත (අ) ඡේදය අනුව කාරක සභාව අවලංගු වන අවස්ථාවකදී එම කාරක සභාව විසුරුවා හැර ඉවත් කළ තැනැත්තන් නොවන අය අතුරින් අළුත් කාරක සභාවක් තෝරාපත් කර ගනු ලැබිය හැකිය. එසේ චෝදනාවට ලක්වූ කාරක සභා සාමාජිකයා හෝ සාමාජිකයන් මහා සභාව විසින් ඉවත් නොකරන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී කාරක සභා සාමාජිකයා හෝ සාමාජිකයන් ඉවත්කර පුරප්පාඩු පුරවා ගන්නා ලෙස නියම කළ යුතු ය. කාරක සභාව අහෝසි වන අවස්ථාවක දී රෙජිස්ට්‍රාර්වරයා විසින් පාලක මණ්ඩලයක් පත්කළ යුතුය.පාලක මණ්ඩලයක් පත්කරන අවස්ථාවක එසේ පත්කරනු ලබන පාලක මණ්ඩලයට සමිතියේ අතුරු ව්‍යවස්ථානුකූලව මහ සභාවකට හිමි මහා සභාව සතු සියළු බලතල තිබිය යුතු ය.

(ඇ) ලියාපදිංචි කළ සමිතියක සමස්ථ කාරක සභාවම නියමිත ආකාරයට ස්වකීය කාර්යය ඉටු නොකරන බව 41 වන වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසු රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන්නේ නම්, ඒ කාරක සභාව විසුරුවා හැරීමට විරුද්ධව හේතු කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීමට ඒ කාරක සභාවට අවස්ථාවක් ලබාදීමෙන් පසු රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් කැඳවනු ලබන මහා සභාව වෙත තමා සොයාගත් කරුණු හා මතය වාර්තා කළ යුතු අතර, එකී කාරක සභාව ඉවත්කර වෙනත් කාරක සභාවක් පත්කර ගන්නා ලෙස දැන්විය යුතු ය. එකී මහා සභාව විසින් ඒ කාරක සභාව එම අවස්ථාවේම ඉවත් කරනු ලැබිය යුතු අතර එසේ ඉවත් කළ තැනැත්තන් නොවන අනිකුත් සාමාජිකයන් අතුරින් කාරක සභාව තෝරාපත් කර ගත යුතුය. එසේ කාරක සභාව ඉවත්කර නව කාරක සභාවක් පත් කිරීම සඳහා මහා සභාව විසින් කටයුතු නොකරන අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ කාරක සභාව ඉවත් කිරීමෙන් පසු පාලක මණ්ඩලයක් පත්කළ යුතු ය. මෙසේ පත්කරන ලද කාරක සභාවක හෝ පාලක මණ්ඩලයක නිල කාලය 43(2) වගන්තියේ විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

(ඈ) එසේ (අ), (ආ) සහ (ඇ) වගන්ති අනුව ඉවත්කරනු ලැබූ කාරක සභිකයින් වර්ෂ හතක් ගතවන තුරු කිසිම සමුපකාර සමිතියක කිසිදු නිලයක් දැරීමට, නිලයකට පත්වීමට සහ පත්කරනු ලැබීමට නුසුදුස්සන් වන්නේය.

(ඉ) (i) යම් ලියාපදිංචි සමිතියක මහා සභාවේ විශ්වාසභංග යෝජනා සම්මතයකින් ඉවත් කරනු ලැබූ කාරක සභිකයෙකු වර්ෂ හතක් ගතවන තුරු කිසිම සමුපකාර සමිතියක කිසිදු නිලයක් දැරීමට, නිලයකට පත්වීමට සහ නිලයකට පත්කරනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය.

(ii) එසේම 41 විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසු, පූර්ව කාරක සභාවක කටයුතු කරඇති තැනැත්තකු හෝ තැනැත්තන් චෝදනාවලට ලක්ව ඇති අවස්ථාවක එකී චෝදනා සම්බන්ධව නියෝගයක් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත. එකී නියෝගය අනුව අදාළ තැනැත්තා හෝ තැනැත්තන් වරද කර ඇති බවට නියෝග කරනු ලබන්නේ නම් එසේ නියෝග කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැක්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අවස්ථාව දිය යුතු ය. මේ අනුව වරදකරු බවට නියෝග කර ඇති තැනැත්තෙකුට එකී නියෝගයේ දින සිට වසර හතක් ගතවන තෙක් කිසිදු සමුපකාර සමිතියක කිසිදු නිලයක් දැරීමට, නිලයකට පත්වීමට සහ කිසිදු නිලයකට පත්කරනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය. තව ද ධුරයක් හෝ ධුර දරන්නේ නම් එම ධුරය හෝ ධුර දැරීම එම කරුණින්ම නතර වන්නේය.

(ඊ) ඉහත (අ), (ආ), (ඇ) සහ (ඉ)(i) හා (ඉ)(ii) වගන්ති අනුව ඉවත් කරනු ලැබූ මූල්‍ය චෝදනාවන්ට ලක්වූ කිසිදු කාරක සභිකයෙකු හට කිසිදු සමුපකාර සමිතියක කිසිදු නිලයක් දැරීමට සහ කිසිදු නිලයකට පත්වීමට හා පත් කරනු ලැබීමට නුසුදුස්සෙක් වන්නේය.එලෙස නුසුදුසු වූ අයගේ නම් අසාදු ලේඛනගතකර වාර්ෂිකව ගැසට් කිරීම හා සමුපකාර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කිරීම රෙජිස්ට්‍රාර් විසින් කළ යුතු ය.

(2). (අ) ඉහත (1) උපවගන්තියේ (අ)(ආ) ඡේද අනුව තෝරාපත්කර ගනු ලැබූ කාරක සභාව හෝ එසේ පත්කර ගනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසුරුවා හරිනු ලැබූ කාරක සභාවේ ධුර කාලයෙන් ඉතිරිව ඇති කාලය සඳහා ධුරය දැරිය හැකිය.

(ආ) එසේ පත්කරනු ලබන පාලක මණ්ඩලයකට ඉහත අනු උපවගන්තියේ සඳහන් කාලය තුළ ධුරය දැරිය හැකි අතර එකී පාලක මණ්ඩලයට සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවක බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(3) ඉහත (1) උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද අනුව පත්කරනු ලැබූ තැනැත්තා හෝ තැනැත්තන් විසින් සමිතියේ යථා පරිදි පත්කරන ලද කාරක සභාවක සියළු බලතල අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(4) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද අනුව පත්කරන ලද යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් මෙම ප්‍රඥප්තිය හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ නියෝගවලට පටහැනිව ඔවුන් විසින් සිදුකරන ලද යම් ක්‍රියා මගින් සිදුකරන ලද යම් පාඩු සඳහා තනි තනිව හා සාමුහිකව වගකිව යුතු ය.

(5) ලියාපදිංචි සමිතියක කටයුතු කළමණාකරණය කිරීම මේ වගන්තිය යටතේ පත්කරනු ලැබූවා වූද (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ විධාන බලරහිත වීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුරය හෝ ධුර දරමින් සිටියා වූ තැනැත්තා හෝ තැනැත්තන් විසින් එකී දිනයට පෙර සමිතියේ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව නව කාරක සභාවක් තෝරාපත් කිරීම සඳහා කටයුතු සැලැස්වීම ඒ තැනැත්තා හෝ තැනැත්තන්ගේ කාර්යය වන්නේය.

(6) මේ ප්‍රඥප්තියේ 45 වන වගන්තිය යටතේ සමිතියේ ලියාපදිංචිය අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට ඇති බලය කෙරෙහි මේ වගන්තියේ කිසිවකින් බලපෑමක් ඇතිකර වන්නේ යැයි සලකනු නොලැබිය යුතු ය.

(7). සමිතියේ කාරක සභාව අකර්මන්‍යව ඇති අවස්ථාවක රීති මාලාව අනුව හෝ අතුරු ව්‍යවස්ථානුකූලව හෝ කැඳවන ලද සමිතියක මහා සභාව විසින් එම සමිතියේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරනු ලබන පාලක මණ්ඩලයකට භාරකරන ලෙසට යෝජනාවක් සම්මත කර රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලීමක් කළහොත් තිදෙනෙකුට නොඅඩු පාලක මණ්ඩලයක් පත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇති වන්නේය. එසේ පත්කළ පාලක මණ්ඩලය මෙහි (2) (ආ) අනු උපවගන්තියේ විධිවිධානවලට අනුකූල විය යුතු ය. රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරනු ලබන අය අතුරින් සභාපති හෝ උප සභාපති හෝ ඒ දෙදෙනාම හෝ නම් කිරීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා සතු වන්නේය.

***9 වන පරිච්ඡේදය***

**ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව විසුරුවා හැරීම.**

විසුරුවා හැරීම.

44. (1) 41(1) වන උපවගන්තිය යටතේ වූ විභාගයකින් පසු නැතහොත් පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසු හෝ ලියාපදිංචි කළ සමිතියක මහා සභා සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක කොටසක් විසින් විසුරුවා හැරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් පසු හා තම විරෝධතා ඉදිරිපත් කිරීමට සමිතියට සහ සමිතියේ ණය හිමියන්ට අවස්ථාවක් ලබා දීමෙන් පසු සමිතිය විසුරුවා හැරිය යුතු යැයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරයි නම් ඒ සඳහා ඔහු විසින් තම අත්සන යටතේ වූ නියෝගයක් මගින් ඒ සමිතියේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකිය.

(2) ලියාපදිංචි කළ යම් සමිතියක යම් සාමාජිකයෙකු විසින් හෝ ණය හිමියෙකු විසින් (1) වන උපවගන්තිය යටතේ වූ නියෝගයක දිනයේ සිට දින 60 ක් ඇතුළත ඒ නියෝගයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැකිය. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අභියාචනයේ සඳහන් දින සිට දින හැටක් ඇතුළත තීරණය ලබා දිය යුතු ය.

(3) සමිතියක ලියාපදිංචිය අවලංගු කරමින් නියෝගයක් කිරීමේ දින සිට දින හැටක් ඇතුළත කිසියම් ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ නියෝගය ඒ කාලය ගතවූ විට ක්‍රියාත්මක විය යුතු ය. දින හැටක් ඇතුළත ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක නියෝගය ස්ථිර කරනු ලබන තෙක් ඒ නියෝගය බලනොපැවැත්විය යුතු ය.

(4) සමිතියක ලියාපදිංචිය රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ අවස්ථාවක සමිතියේ ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන තෙක් හෝ ආයාචනයකදී අමාත්‍යවරයා විසින් නියෝගය අවලංගු කරනු ලබන තෙක් සමිතියේ පොත්, ලේඛන හා වෙනත් දේපළ භාරව සිටීමට හා ඒ සමිතියේ කටයුතු පාලනය කිරීම සඳහා එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කළ හැකිය. ඒ තැනැත්තා හෝ තැනැත්තන් පත්කරනු ලැබූ විට සමිතියේ කාරක සභාව විසින් හෝ සමිතියේ පොත් ලේඛන හා වෙනත් දේපළ භාරව සිටින වෙනයම් තැනැත්තෙකු විසින් ඒ පොත් ලේඛන හෝ දේපළ පළමු සඳහන් තැනැත්තා හෝ තැනැත්තන් වෙත භාරදිය යුතු අතර ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වනතුරු හෝ අමාත්‍යවරයා විසින් අභියාචනයකදී ඒ නියෝගය අවලංගු කරනු ලබන තෙක් ඒ කාරක සභාව අක්‍රිය විය යුතු ය.

45. යම් ලියාපදිංචි කළ සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීම. සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීම.

(අ) සමිතිය යටත් පිරිසෙයින් සාමාජිකයන් විසි දෙනෙකුගෙන්වත් සමන්විත විය යුතු බව ඒ සමිතිය ලියාපදිංචි කිරීමේ කොන්දේසියක් වන අවස්ථාවක ඒ සමිතියේ සාමාජික සංඛ්‍යාව විස්සකට වඩා අඩුවී ඇත්නම් ; හෝ

(ආ) සමිතිය ලියාපදිංචි කළ දින සිට අවුරුදු එකක කාල පරිච්ඡේදයක් තුළ ඒ ලියාපදිංචි කළ සමිතිය වැඩ ආරම්භකොට නැත්නම් හෝ මේ වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝගය පැනවීමේ දිනයට පෙර අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් තුළ අක්‍රියව තිබුනේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් එම සමිතියේ ලියාපදිංචිය අවලංගු කළ හැකිය.

(ඇ) යම් ලියාපදිංචි සමුපකාර සමිතියක පොත්පත්, ලිපි ලේඛන හා කාරක සභාව හෝ සාමාජිකයන් හෝ වෙනත් පාර්ශවයක් ඉදිරිපත් නොවන අවස්ථාවක හිමිකම් පෑම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් ඔවුන්ට මාස 03 ක කාලයක් ලබා දීමෙන් අනතුරුව රෙජිස්ට්‍රාර්වරයා විසින් *ගැසට් පත්‍රයක්* මගින් දැන්වීම පළකිරීමෙන් ලියාපදිංචිය අවලංගු කළ හැකිය. තව ද, ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසුව ඉදිරිපත් වන කිසිදු හිමිකම් පෑමකට රෙජිස්ට්‍රාර්වරයාගේ බැඳීමක් නොමැති විය යුතු ය.

(ඈ) (1) ලියාපදිංචි කර තිබූ සමුපකාර සමිතියකට කොමසාරිස්වරයාට හෝ කොමසාරිස්වරයා බලය පැවරූ අන් තැනැත්තෙකු එම සමිතියට ඇතුළු වීමට හෝ පොත්පත් පරීක්ෂා කිරීමට හෝ පොත්පත් ඉදිරිපත් කිරීමට දැන්වූ විට එයට බාධා කරන අවස්ථාවක හා කාරක සභා, මහා සභා රැස්වීම්වලට සහභාගීත්වය වළක්වනු ලබන අවස්ථාවක හෝ වාර්ෂික විගණනය යාවත්කාලීන නොකරන අවස්ථාවක හෝ තැන්පත්කරුවන් වෙනුවෙන් ඉටුකරන අදාළ වගකීම් ඉටු නොකරනු ලබන අවස්ථාවක දී හෝ සමිතියේ මහා සභාවේ සාමාජිකයන්ගෙන් 2/3 කට නොඅඩු සංඛ්‍යාවකගේ ඉල්ලීමක් කොමසාරිස් වෙත විධිමත්ව ලද විටක දී රෙජිස්ට්‍රාර්වරයාගේ අභිමතය පරිදි වෙනත් ලියාපදිංචි සමිතියකට ඒකාබද්ධ කිරීමට හෝ ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ සමුපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට අමාත්‍යතුමාගේ නිර්දේශ මත නියෝගයක් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට බලය ඇත්තේය.

(2) පළාත් අමාත්‍ය මණ්ඩල නියෝගය ලැබීමෙන් පසුව එම නියෝගය අනුව ඒකාබද්ධ කිරීම හෝ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ සමුපකාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීම හෝ කළ යුතුය.

46. ලියාපදිංචි කළ සමිතියක ලියාපදිංචිය 44 වන වගන්තිය හෝ 45 වෙනි වගන්තිය යටතේ වූ නියෝගයකින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක මෙහි මින් මතු විසුරුවා හැරීමේ දිනය වශයෙන් සඳහන් කෙරෙන ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට ඒ සමිතිය සංස්ථාවක් ලෙස පැවතීම නතර විය යුතු ය. ලියාපදිංචිය අවලංගු කිරීමේ බලපෑම.

එසේ වුව ද මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් නෛතික විධිවිධාන යටතේ සමිතිය වෙත පැවරුණු යම් වරප්‍රසාද රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය සඳහා පත්කරනු ලැබූ ඈවරකරුවෙකු හෝ ඈවරකරුවන් වෙත ඒකාබද්ධ කරනු ලැබූ ලෙස සැලකිය යුතුය. සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසු ඈවර කිරීම.

47. 44 වන වගන්තිය හෝ 45 වන වගන්තියේ (ඇ) සහ (ඈ) උපවගන්ති හැර එම වගන්තිය යටතේ ඇති සෙසු උපවගන්ති යටතේ සමිතියක් ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ අවස්ථාවක ඒ සමිතියේ ඈවරකරු හෝ ඈවරකරුවන් වශයෙන් එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කළ හැකිය.

අවස්ථාවෝචිත පරිදි 44 වන වගන්තිය හෝ 45 වන වගන්තියේ (ඇ) සහ (ඈ) උපවගන්ති හැර එම වගන්තිය යටතේ ඇති සෙසු උපවගන්ති යටතේ අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන දිනයෙහි සමිතියේ සියලුම දේපළ ඈවරකරු හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබිය යුතු ය.

ඈවරකරුවෙකු වෙත ඇති බලය.

48. (1) 47 වන වගන්තිය යටතේ පත්කරන ලද ඈවරකරුට රෙජිස්ට්‍රාර්වරයාගේ මග පෙන්වීම හා පාලනයට සහ 49 වන වගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන යම් සීමා කිරීම්වලට යටත්ව පහත සඳහන් කටයුතු කිරීමේ බලය තිබිය යුතුයඃ

(අ) සමිතියේ වත්කම්වලට සමිතියේ සාමාජිකයින් හා හිටපු සාමාජිකයින් විසින් ගෙවිය යුතු හෝ සමිතියේ මියගිය සාමාජිකයන්ගේ බූදල්වලින් ලැබිය යුතු දායක මුදල් කලින් කල නිශ්චය කිරීම,

(ආ) හිමිකම් කියාපෑම සමිතියේ පොත්පත්වල එතෙක් සටහන් වී නැති ණය හිමියන් විසින් සිය හිමිකම් කියාපෑම ඇතුළත් කරවා ගැනීම් සඳහා ඒවා ඉදිරිපත් කළ යුත්තේ හෝ ඒ හිමිකම් කියාපෑම් ඔවුන් විසින් තහවුරු කිරීමට පෙර කෙරෙන වත්කම් බෙදාදීමෙන් ඒ ණය හිමියන් අත්හරිනු ලැබිය යුත්තේ යම් දිනකට පෙර ද ඒ දිනය ප්‍රකාශයකින් හෝ දැන්වීමකින් නියම කිරීම,

(ඇ) ණය හිමියන් අතර උද්ගතවන ප්‍රමුඛත්වය පිළිබඳ යම් ප්‍රශ්නයක් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව තීරණය කිරීම,

(ඈ) 53 වන වගන්තියේ සඳහන් යම් විස්තරයක් යම් ආරවුලක් (සමිතිය සම්බන්ධයෙන් එහි වූ සඳහන් කිරීම ඈවරකරු සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් ලෙස තේරුම් ගෙන) ඒ වගන්තිය යටතේ බේරුම් කිරීම සඳහා යොමුකිරීම හා සමිතිය වෙනුවෙන් තමාගේ නමින් ධූරයෙන් සිවිල් නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීම හා නීතිකෘත්‍යවලදී ප්‍රතිවාද ඉදිරිපත් කිරීම,

(ඉ) ඈවර කිරීමේ ගාස්තු කවර පුද්ගලයන් විසින් හා කවර ප්‍රමාණවලින් දැරිය යුතු ද යන්න තීරණය කිරීම,

(ඊ) සමිතිය ගණන් බේරා වසා දැමීමේදී අවශ්‍ය විය හැකි වත්කම් එකතුකොට බෙදාදීම සම්බන්ධයෙන් විධාන කිරීම,

(උ) රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය කලින් ලැබ ඇත්නම් සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් කියාපෑම් සමථයකට පත්කිරීම,

(ඌ) ඈවර කිරීම නිසිලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම් කැඳවීම,

(එ) සමිතියේ පොත් ලේඛන හා වත්කම් තමා සන්තකයට ගැනීම,

(ඒ) සමිතියේ දේපළ විකිණීම,

(ඔ) වැඩදායී ලෙස ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය විය හැකිතාක් දුරට සමිතියේ කටයුතු පවත්වාගෙන යාම. එසේ වුව ද ණය දෙන සමිතියක ඈවරකරුට යම් ණය මුදලක් නිකුත් කිරීම සඳහා මෙහි අඩංගු කිසිවකින් හිමිකම් නොලැබිය යුතුය,

(ඕ) රෙජිස්ට්‍රාර්වරයා විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමයක් අනුමත කරනු ලැබූ විට සමිතියේ වත්කම් පහසු ආකාරයකින් බෙදාදීම සඳහා කටයුතු පිළියෙළ කිරීම.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පත්කරන ලද යම් ඈවරකරුවෙකුට ඒ වෙනුවෙන් සාදනු ලැබිය හැකි යම් නියෝගවලට යටත්ව මේ වගන්තියේ කාර්යයන් කරගෙන යාම පිණිස යම් බලතල අවශ්‍ය වන ප්‍රමාණයට දිසා අධිකරණයක් සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ විධිවිධාන සලස්වා ඇති මාර්ගයෙන්ම හා (අවශ්‍ය විය හැකි පමණින්) ඒ ආකාරයටම පාර්ශවකරුවන් හා සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණ සිටීමට ඔවුන්ට බල කිරීමටත් ලේඛන ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට බල කිරීමටත් බලය තිබිය යුතුය.

49. ඈවරකරු රෙජිස්ට්‍රාර්වරයාගේ පාලනයට හා විධානයට යටත්ව සිය බලතල ක්‍රියාවේ යෙදවිය යුතු අතර, (ඈවර කිරීම පාලනය කිරීමට රෙජිස්ට්‍රාර්වරයා සතු බලය.)

(අ) ඈවරකරුවකු විසින් කරනු ලබන යම් නියෝගයක් පරිච්ඡින්න කොට හෝ වෙනස් කොට අවශ්‍ය කවර හෝ අලුත් නියෝගයක් කිරීම ද,

(ආ) ඈවරකරුවෙකු ධුරයෙන් ඉවත් කිරීම ද,

(ඇ) සමිතියේ සියලු පොත් ලේඛන හා වත්කම් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම ද,

(ඈ) 48 වන වගන්තිය යටතේ වූ ඈවරකරුගේ බලතල ලියවිල්ලකින් වූ නියෝගයකින් සීමා කිරීමට ද,

(ඉ) ගණන් ඉදිරිපත් කරන ලෙසට ඈවරකරුට තම අභිමතය පරිදි නියම කිරීම ද,

(ඊ) ඈවරකරුගේ ගණන් විගණනය කරවා ගැනීම හා සමිතියේ වත්කම් බෙදා දීමට බලය පැවරීම ද,

(උ) ඈවරකරුට පාරිශ්‍රමික ගෙවීමට නියෝග කිරීමට ද,

(ඌ) ඈවරකරු හා යම් තෘතීය පාර්ශවකරුවකු හා පවත්නා වූ 48(1)(ඇ) වගන්තිය යටතේ බේරුම් කිරීමට යොමු කළ හැකි ආරවුලක් නොවන යම් ආරවුලක් ඒ පිළිබඳව බේරුම් කර දෙන තීරණයෙන් බැඳී සිටීම ඒ පාර්ශවකරු ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කරතොත් බේරුම් කිරීම සඳහා යොමු කිරීමට ද රෙජිස්ට්‍රාර් විසින් කළ හැකිය.

(එ) සමුපකාර අතිරික්ත අරමුදල් ගිණුම යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර ඈවරකරු විසින් රැස්කරනු ලබන සියලු මුදල් මෙම අරමුදලට බැරකළ යුතුය. තව ද, මෙම අරමුදල රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතුය.

50. (1) 49 වන වගන්තිය යටතේ තමා වෙත යොමුකරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් වූ බේරුම්කරුගේ තීරණයෙන් පාර්ශවකරුවන් බැඳී සිටිය යුතු අතර ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලැබූ නියෝගයක් ක්‍රියාත්මක කරන ආකාරයට ඒ තීරණය ක්‍රියාත්මක කළ හැකි විය යුතුය. (නියෝග ක්‍රියාත්මක කිරීම.)

(2) බේරුම්කරුවකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් 48 වන වගන්තිය හෝ 49 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක් කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු අතර, ඒ සමිතිය ලියාපදිංචි කරන ලද කාර්යාලය පිහිටි ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති යම් සිවිල් අධිකරණයක් විසින් ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ඒ නියෝග ක්‍රියාත්මක කළ යුතුය. එසේ වුව ද ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක ණය හිමියකු වන යම් බැංකුවකට යම් ඈවරකරුවෙකු හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් 48 වගන්තිය හෝ 49 වන වගන්තිය යටතේ කරන ලද නියෝගයකට විරුද්ධව ඒ ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නියෝගයේ දිනයේ සිට දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත ආභියාචනා කිරීමට හිමිකම් තිබිය යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් අභියාචනයේ සඳහන් දින සිට දින හැටක් ඇතුළත තීරණය ලබා දිය යුතුය.

(3) 48 වන වගන්තිය හෝ 49 වන වගන්තිය යටතේ ඈවරකරුවකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියෝගයක් කිරීමෙන් පසු දින හැටක් ඇතුළත අමාත්‍යවරයා වෙත කිසිම ආභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ එම නියෝගය ඒ කාල පරිච්ඡේදය ගත වීමෙන් පසු බල පැවැත්විය යුතුය. දින හැටක් ඇතුළත අමාත්‍යවරයා (සිවිල් අධිකරණ හා අධිකරණ බලය සීමා කිරීම.)

වෙත ආභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ස්ථිර කරනු ලබන තෙක් ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නියෝගය බල නොපැවැත්විය යුතුය.

51. මෙහි පෙරාතුව ප්‍රකාශිතවම විධිවිධාන සැලසුනු ප්‍රමාණයට හැර මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ සමිතියක් විසුරුවා හැරීමට අදාළව යම් කරුණක් සම්බන්ධයෙන් කිසිම සිවිල් අධිකරණයක කිසිම අධිකරණ බලයක් නොතිබිය යුතුය.

ඈවර කිරීම අවසන් කිරීම.

52. (1) ලියාපදිංචි අවලංගු කරන ලද සමිතියක් ඈවර කිරීමේදී සංචිත අරමුදල ඇතුළු අරමුදල් මේ ප්‍රඥප්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව ප්‍රථම කොට ඈවර කිරීමේ ගාස්තු සඳහා ද ඊළඟට රජයේ හෝ පළාත් සභාවේ ඇප වූ ණය ආපසු ගෙවීම සඳහා ද ඉක්බිතිව සමිතිය වෙනත් වගකීම් ඉටුකිරීම පිණිස ද, ඉක්බිතිව කොටස් ප්‍රාග්ධනය ගෙවීම පිණිස ද, ඉක්බිතිව සමිතියේ අතුරු ව්‍යවස්ථාවෙන් අවසර ලැබෙන්නේ නම් ලාභ බෙදනු නොලැබූ යම් කාල පරිච්ඡේදයක් සඳහා අවුරුද්දකට සියයට දහයකට නොවැඩි ප්‍රමාණයකින් ලාභාංශයක් ගෙවීම සඳහා ද ලාභ පිළිබඳව සුදුස්සක් කරනු නොලැබූ යම් කාල පරිච්ඡේදයක් වෙනුවෙන් ඒ කාල පරිච්ඡේදය විසුරුවා හැරීමේ දිනයට පෙරාතුවම වූ අවස්ථාවක සාමාජිකයන්ට ප්‍රතිදානයක් ගෙවීම සඳහා ද යෙදිය යුතුය.

(2) සමිතියක් ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා ඒ සමිතියේ යම් ණය හිමියකු විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියා පෑමක් ඉදිරිපත් කරනු නොලැබූ හෝ ඒ දේ ඔහුට නොලැබුනහොත් ඈවර කිරීමේ දැන්වීම *ගැසට් පත්‍රයෙහි* පළකළ යුතුය. තව ද, ඒ සමිතියේ අරමුදල් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් කියා පෑමක් පිළිබඳ කිසිම නඩුවක් එය ඒ දැන්වීම *ගැසට් පත්‍රයේ* පළකිරීමේ දින සිට දින අනූවක් ඇතුළත ආරම්භ වන්නේ නම් මිස පවත්වාගෙන නොයා යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කාර්යයන් සඳහා සහ (2) උපවගන්තිය යටතේ නඩුවක් පවරනු ලැබූ යම් හිමිකම් කියා පෑම් ගෙවීම් සඳහා මුදල් යෙදීමෙන් පසු ඉතිරිවන යම් අතිරික්තයක් මේ ප්‍රඥප්තියේ පිහිටුවනු ලැබිය හැකි අතිරික්ත අරමුදලකට ගෙවනු ලැබිය හැකිය.

***10 වන පරිච්ඡේදය***

**ආරවුල්**

ආරවුල් සමථයකට පත්කිරීම.

53. (1) ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයට සම්බන්ධ යම් ආරවුලක්

(*අ*) සාමාජිකයකු, හිටපු සාමාජිකයකු සහ සාමාජිකයන් හිටපු සාමාජිකයන් හා මියගිය සාමාජිකයන් මගින් හිමිකම් කියාපාන තැනැත්තන් අතර හෝ සමිතියේ අතීත හෝ වර්තමාන නිලධරයන් හෝ සේවකයන් අතර හෝ මියගිය නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ උරුමකරුවන්ගේ හෝ නීත්‍යානුකූල නියෝජිතයන් අතර, හෝ

(*ආ*) සාමාජිකයකු, හිටපු සාමාජිකයකු හෝ සාමාජිකයන් හිටපු සාමාජිකයන් හෝ මියගිය සාමාජිකයෙකු මගින් හිමිකම් කියාපාන තැනැත්තකු හා සමිතිය, එහි කාරක සභාව හෝ එහි අතීත හෝ වර්තමාන යම් නිලධරයෙකුගේ හෝ සේවකයකු හෝ මියගිය යම් නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර, හෝ

(*ඇ*) සමිතිය හෝ එහි කාරක සභාව හා සමිතියේ අතීත හෝ වර්තමාන යම් නිලධරයෙකු හෝ සේවකයෙකුගේ හෝ යම් මියගිය නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර, හෝ

(*ඈ*) සමිතිය හෝ එහි කාරක සභාව සහ -

(i) ව්‍යාපාරයක් හෝ ඉන් කොටසක් ඒ සමිතියට පවරනු ලැබූ වෙනයම් සමිතියක සාමාජිකයෙකු හෝ නිලධරයෙකු හෝ සේවකයෙකුව සිටි යම් තැනැත්තෙකු,

(ii) (i) අනු ඡේදයෙහි සඳහන් සමිතියේ සාමාජිකයෙකු හිටපු සාමාජිකයෙකු හෝ මියගිය සාමාජිකයෙකු මගින් හිමිකම් කියාපාන යම් තැනැත්තෙකු

(iii) (i)අනු ඡේදයෙහි සඳහන් යම් නිලධරයෙකු හෝ සේවකයෙකුගේ උරුමකරුවකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු වන යම් තැනැත්තෙකු අතර, හෝ

(ඉ) සමිතිය හා ලියාපදිංචි කළ අන්කිසි සමිතියක් අතර උද්ගත වන්නේ නම් තීරණය සඳහා එම ආරවුල රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමු කරනු ලැබිය යුතුය. අතීත හෝ වර්තමාන සාමාජිකයෙකුගෙන් නිලධරයෙකුගෙන් හෝ සේවකයෙකුගෙන් හෝ මියගිය සාමාජිකයෙකුගේ නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් නම්කළ තැනැත්තකුගෙන් උරුමකරුවකුගෙන් හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකුගෙන් හෝ ලියාපදිංචි සමිතියකට අයවිය යුතු යම් ණයක් ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඒ සමිතිය විසින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම්පෑමක් ඒ ණය ඉල්ලීම හෝ අලාභය පිළිගතයුතු වුව ද නොවුවද මේ උප වගන්තියෙහි අර්ථානුකූලව සමිතියේ ව්‍යාපාරයට අදාළ ආරවුලක් ලෙස සලකනු ලැබිය යුතුය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ යොමුකිරීමක් ලැබීමෙන් පසු,

(අ) තමා විසින්ම ඒ ආරවුල සම්බන්ධයෙන් තීරණය කළ හැකිය. නැතහොත්

(ආ) ඒ පිළිබඳව සුදුස්සක් කිරීම සඳහා බේරුම්කරුවකු හෝ බේරුම්කරුවන් වෙත යොමුකළ හැකිය.

(3) (අ) බේරුම්කරුවකුගේ හෝ බේරුම්කරුවන්ගේ හෝ තීන්දුවකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවන් විසින් එකී තීන්දුවට විරුද්ධව රෙජිස්ට්‍රාර්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. තීන්දුවකට විරුද්ධව රෙජිස්ට්‍රාර්වරයාට කරන ඕනෑම අභියාචනයක් ඊට හේතු ලියවිල්ලකින් දක්වමින්, තීන්දුවදෙන ලද දින සිට දින 60 ක් ඇතුළත කළ යුතු වේ. එවැනි අභියාචනයක් කරනු ලබන්නේ තීරක විභාගයක වගඋත්තරකරුවකු විසින් තමාට විරුද්ධව දෙන ලද තීන්දුවකට එරෙහිව නම් එම තීන්දු කරනු ලබන මුදලින් 10% ක්ද අභියාචනා ඉදිරිපත් කරනු ලබන්නේ පැමිණිලි පාර්ශ්වය විසින් නම් තීරක විභාගයේදී ඉල්ලා සිටි මුළු මුදලින් 10% ක්ද වශයෙන් අභියාචනා තැන්පත් මුදලක් ද එම අභියාචනය සමග යැවිය යුතුය. එතෙකුදු වුවත් කවර පාර්ශ්වකරුවකු විසින් හෝ ආභියාචනා තැන්පත් වශයෙන් යැවිය යුතු මුදල රුපියල් දහසකට අඩු නොවිය යුතු අතර රුපියල් පනස් දහසක් නොඉක්මවිය යුතුය.

(ආ) ඉහත සඳහන් (අ) වන උප වගන්තියට අනුකූලව නොකරන අභියාචනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

(4) (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ කිසිම පාර්ශ්වකරුවකුට ඒ පාර්ශ්වකරු විසින් යම් නියෝජිතයෙකු මාර්ගයෙන් රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ පෙනී සිට ඒ අභියාචනය සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට ඉල්ලීමක් කර අවසර ලබාගත හැකිය.

(5) (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ හෝ අභියාචනයකදී රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව කිසිදු සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(6) (2) වන උපවගන්තිය යටතේ බේරුම්කරුවෙකුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුව සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත කිසිම අයාචනයක් යොමුකරනු නොලබන්නේ නම් හෝ එබඳු යම් ආයාචනයක් අත්හරිනු ලබන්නේ නම් හෝ ඉල්ලා අස්කර ගනු ලබන්නේ නම් ඒ තීන්දුව අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව කිසිදු සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(7) මේ වගන්තිය යටතේ ආරවුලක විෂය වන යම් හිමිකම් කියාපෑමක් සම්බන්ධයෙන් කාලාවරෝධන ආඥාපනතේ විධි විධාන අදාළ නොවිය යුතුය.

(8) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමුකරනු ලැබූ ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයට අදාළ ආරවුලක් ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගතවුවහොත් ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(09) මේ වගන්තියෙහි "සාමාජිකයා" යන්නට ආශ්‍රිත සාමාජිකයෙක්ද ඇතුළත් වේ.

(10) මෙම වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා සහ ආරවුල් බේරුම්කරුවකු වශයෙන් පත්කරනු ලැබූ තීරකවරයා දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයෙකු ලෙස සැලකිය යුතුය.

තීරණයක් හෝ තීන්දුවක් ක්‍රියාත්මක කිරීම.

54. (1) 53 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යොමුකරනු ලැබූ ආරවුලක් හෝ අභියාචනයක් සම්බන්ධයෙන් ඔහුගේ තීරණයකින් (මේ වගන්තියෙහි මින් මතු එය "තීරණයක්" යනුවෙන් හඳුන්වනු ලැබේ.) හෝ ඒ වගන්තිය යටතේ බේරුම්කරුවෙකු වෙත යොමුකරනු ලැබූ ආරවුලක් පිළිබඳ වූත් ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යථා පරිදි ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූත්, මේ වගන්තියේ මින් මතු තීන්දුවක් යනුවෙන් හඳුන්වනු ලබන තීන්දුවකින් කෙරෙන නිගමනය ඒ ආරවුලේ එක් පාර්ශ්වකරුවකුගෙන් ඒ ආරවුලේ අනෙක් පාර්ශ්වකරුට මුදලක් අයවිය යුතු බව වූත් ඒ මුදල ඊට සම්බන්ධ ගාස්තු හා පොළී ඇතොත් ඒවා සමග නොගෙවා ඇත්තා වූත් අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ මුදල් අයවිය යුත්තේ යම් පාර්ශ්වකරුවකුගෙන්ද මේ වගන්තියේ මින්මතු පැහැර හරින්නා යනුවෙන් හඳුන්වනු ලබන ඒ පාර්ශ්වකරු සම්බන්ධයෙන්,

(අ) ගාස්තු හා පොළී ඇතොත් ඒ පොලියද සමග ඒ මුදල් පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක් ඒ පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඒ පැහැර හරින්නාට අයත් යම් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණයක් වෙත නිකුත් කිරීම, හෝ

(ආ) අය විය යුතු මුදල පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම සහ අන්තිමට දැනගත් ඔහුගේ ව්‍යාපාරික හෝ පදිංචි ස්ථානය අඩංගු සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයෙකු වෙත නිකුත් කිරීම් කළ හැකිය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක එය ලැබීමෙන් පසු ඒ අධිකරණය විසින් ඒ පැහැර හරින්නාගේ සියලුම චංචල හෝ නිශ්චල දේපළ හෝ ඉන් යමක් හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා පිස්කල් විසින් අවශ්‍ය යැයි සැලකිය හැකි ඉන් යම් කොටසක් තහනමට ගෙන විකුණන ලෙස පිස්කල්ට බලය පැවරෙන හා නියම කෙරෙන දේපළ තහනම් ඇස්කීසියක් පිස්කල් වෙත නිකුත් කරන ලෙස විධානය කළ යුතුය. ඒ තහනමට ගෙන විකිණීම කෙරෙහි සහ ඊට අදාළ 1979 අංක 15 දරන සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වැනි වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(3) (1) වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත සහතිකය නිකුත් කරනු ලැබූ අවස්ථාවක මුදල් අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව වැඩිදුරටත් ක්‍රියා නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම් බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි වුවද දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වුවද දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදකට ඒ පැහැර හරින්නා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරෙන දඩයක් ලෙස ඒ මුදල සලකනු ලැබිය යුතුය. එවිට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වැනි වගන්තියේ (ඒ වගන්තියෙන් (1) වන උප වගන්තියේ (අ) සහ (ඇ) ඡේද හැර) විධිවිධාන අදාළ විය යුතු අතර, ඒ දණ්ඩන නීතිය නියමය කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් ඔහු විසින් කළ හැකිය. දඩයක් ලෙස මුදල් ගෙවීමට පැහැර හරින්නා එකඟත්වය පළ කරන විට එම මුදල රෙජිස්ට්‍රාර්වරයා විසින් සඳහන් කරන ලද බැංකු ගිණුමකට හෝ වෙනත් ආකාරයට ගෙවන ලෙසට මහෙස්ත්‍රාත්වරයෙකු විසින් පැහැරහරින්නෙකුට නියම කළ හැකි අතර කුවිතාන්සිය නීත්‍යානුකූල බව පිළිබඳ සෑහීමට පත්වන අවස්ථාවක, එය අධිකරණයට ගෙවන ලද මුදලක් ලෙසට සලකා නියෝග කිරීමට මහෙස්ත්‍රාත්වරයෙකුට බලය ඇතිවේ.

(4) 1979 අංක 15 දරන අපරාධ නඩු සංග්‍රහ පනතේ 291 වගන්තිය අනුව නියම කරනු ලැබූ දඩය පැහැර හැරීමේලා බන්ධනාගාරගත කිරීමේ කාලයට දණ්ඩන නියමයක් කරනු ලැබූ යම් පැහැර හරින්නෙකු 54 (1)(ආ) වගන්තියේ නිශ්චිත සහතිකයේ සඳහන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් නිදහස් කරනු නොලැබිය යුතුය.

(5) රෙජිස්ට්‍රාර්වරයා මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන අවස්ථාවක ඒ පිළිබඳව නිවේදනයක් පෞද්ගලිකව භාරදීමෙන්, ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ විද්‍යුත් පණිවුඩ මාර්ගයෙන් යැවීමෙන් පැහැර හරින්නා වෙත නිකුත් කළ යුතුය. එහෙත් පැහැර හරින්නා ඒ නිවේදනය නොලැබීම හේතු කොටගෙන මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍ය අවලංගු නොවිය යුතුය.

(6) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යවලදී රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකයෙහි වූ යම් ප්‍රකාශයක නිවැරදිභාවය සලකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳව තීරණය කිරීමට යම් දිසා අධිකරණයක හෝ මහෙස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය නොහොත් නියම නොවිය යුතුය.

(7) (2) වන උපවගන්තිය යටතේ විකිණීමෙන් ලත් යම් මුදලක් හා (3) වන උපවගන්තිය යටතේ ගෙවන ලද හෝ අයකරන ලද යම් මුදලක් අවස්ථාවෝචිත පරිදි දිසා අධිකරණය හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ මුදල් සම්බන්ධයෙන් අදාළ තීරණය හෝ තීන්දුව අනුව සුදුස්සක් කළ යුතුය.

*11 වන පරිච්ඡේදය*

**ලියාපදිංචි කළ සමිතිවලට අදාළ විශේෂ විධිවිධාන**

55. (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ඒ සමිතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඒ තැනැත්තා විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත අභියාචනය කළ හැකිය. ඒ අභියාචනය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණය දින හැටක් ඇතුළත ලබා දිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයාගේ එම තීරණය අවසානාත්මක විය යුතු අතර එය පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතුය.

වෙනත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කළ යුතු බව.

(2) ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයෙකු ඒ සමිතියේ ධුරයකට යථා පරිදි තෝරාපත්කර ගන්නා ලද්දේ ද යන්න සම්බන්ධයෙන් හෝ සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකුව හෝ නිලධරයෙකුව සිටීම නතර වූයේද යන්න සම්බන්ධයෙන් හෝ සමිතියේ යම් මහා සභාවක් සහ කාරක සභා රැස්වීමක් වලංගු ලෙස පවත්වනු ලැබුවේද යන්න සම්බන්ධයෙන් හෝ යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කළ යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයාගේ එම තීරණය අවසානාත්මක විය යුතු අතර එය පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතුය.

56. ලියාපදිංචි කළ සමිතියක් විසින් රජයෙන් හෝ පළාත් සභාවෙන් ණයක් අත්තිකාරමක්, ප්‍රදානයක් හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශ මත වෙනත් යම් රාජ්‍ය හෝ රාජ්‍ය අනුබද්ධ ආයතනයකින් ණයක් අත්තිකාරමක් හෝ ප්‍රදානයක් හෝ ලබා ගන්නා විට හෝ එවැනි සෑම ණයක්ම අත්තිකාරමක් හෝ ප්‍රදානයක් වන මුදලක්ම පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතුය.

විශේෂ කොන්දේසි.

(1) සමිතියේ පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපළක් මිලට ගැනීමට, බද්දට ගැනීමට, ත්‍යාගයක් වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීමට පෙර හා එවැනි යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් යම් ආකාරයකින් නියාදනය කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතුය.

නිලධරයන්ගේ සේවකයන්ගේ වැඩ අත්හිටුවීම හෝ ඔවුන්ගේ වැඩ තහනම් කිරීම සහ ඔවුන් ඉවත් කිරීම් ආදිය.

(2) (අ) 41 වගන්තිය යටතේ සිදු කරන විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් හෝ 40(2) උපවගන්තිය යටතේ වූ නියෝගයක් මත, රෙජිස්ට්‍රාර්වරයා විසින් නිදහසට කරුණු

විමසා ඒ සඳහා ඉදිරිපත් කරන ලද නිදහසට කරුණු සම්බන්ධව රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් නොවූ විටක එවැනි පූර්ව කාරක සභිකයෙකු පරීක්ෂණ කාලයට අදාළ කාල සීමාවෙන් පසුව අදාළ සමිතියේ කාරක සභාවට තේරී පත් වී සිටින්නේ නම් ඒ තැනැත්තා ඉවත් කරනු ලැබිය යුතු අතර ඒ තැනැත්තාට වර්ෂ හතක් ගතවන තුරු කිසිදු ලියාපදිංචි සමුපකාර සමිතියක කාරක සභික ධූරයකට හෝ නිලයකට තේරීපත් වීමට නොහැකි විය යුතුවාක් මෙන්ම 43.(1)(අ) සහ 43(1)(ආ) වගන්ති යටතේ තීරණයක් ලැබූ පුද්ගලයෙකු කිසිදු ලියාපදිංචි සමුපකාර සමිතියක කාරක සභික ධූරයකට පත්වීමට නුසුදුස්සකු විය යුතුය.

(ආ) 41 වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව ලියාපදිංචි කළ සමුපකාර සමිතියක යම් නිලධරයකු විසින් තම කාර්යය නිසි අයුරින් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීම නුසුදුසු බව හෝ වෙනත් ආකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයා විසින් නිගමනය කරනු ලැබූවහොත් මේ ප්‍රඥප්තියේ හෝ වෙනයම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද ස්වකීය විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නිලධරයාට ලබාදීමෙන් පසුව අවශ්‍යවන පරිදි පරීක්ෂණයක් පැවැත්වීමට බලාපොරොත්තුවෙන් නිලධාරියාගේ තනතුර අත්හිටුවීමට ලිඛිත නියමයක් මගින් කරනු ලැබිය හැකිය. පෙර සඳහන් පරීක්ෂණයෙන් වැරදිකරු වන නිලධාරියෙකුට ලියාපදිංචි කළ සමුපකාර සමිතියක කිසිදු නිලයකට ඉදිරිපත් විය නොහැකිය. එසේ ඉවත් කරනු ලැබිය හැකි තැනැත්තාට ඉවත් කරනු ලැබූ දිනයේ සිට වසර හතක් යන තුරු කිසිදු සමුපකාර සමිතියක කිසිදු තනතුරකට පත්වීමට නොහැකිය.

(ඇ) 41 වගන්තිය යටතේ පවත්වනු ලැබූ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව ලියාපදිංචි කළ සමුපකාර සමිතියක යම් සේවකයෙකු විසින් තම කාර්යය නිසි අයුරින් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීම නුසුදුසු බව හෝ වෙනත් ආකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයා විසින් නිගමනය කරනු ලැබූවහොත් මේ ප්‍රඥප්තියේ හෝ වෙනයම් ලිඛිත නීතියක කුමක් සඳහන් ඇතද ස්වකීය විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සේවකයාට ලබාදීමෙන් පසුව අවශ්‍යවන පරිදි පරීක්ෂණයක් පැවැත්වීමට බලාපොරොත්තුවෙන් සේවකයාගේ තනතුර අත්හිටුවීමට ලිඛිත නියමයක් මගින් කරනු ලැබිය හැකිය. පෙර සඳහන් පරීක්ෂණයෙන් වැරදිකරු වන සේවකයෙකුට කිසිදු ලියාපදිංචි කළ සමුපකාර සමිතියක තනතුරකට ඉදිරිපත් විය නොහැකිය. එසේ ඉවත් කරනු ලැබිය හැකි තැනැත්තාට ඉවත් කරනු ලැබූ දිනයේ සිට වසර හතක් යන තුරු කිසිදු සමුපකාර සමිතියක කිසිදු තනතුරකට පත්වීමට නොහැකිය. එසේ වුවද මේ උපවගන්තිය යටතේ කරන ලද ඉවත් කිරීමේ නියමයකින් අතෘප්තියට පත් යම් සේවා නියුක්තකයෙකු විසින් දවස් 30 ක් ඇතුළත දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් කළ හැකි අතර ඒ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේය.

57. ලියාපදිංචි සමිතියක කටයුතු කාර්යක්ෂමව කළමණාකරණය කිරීම සහතික කර ගැනීම සඳහා, තැන්පත් කරුවන්ගේ තැන්පතුවල ආරක්ෂාව, සාමාජික අයිතිවාසිකම් ආරක්ෂාකර දීම,ඒ සමිතියට රජයෙන් හෝ පළාත් සභාවෙන් කරන ලද ආයෝජන හෝ මුදලින් නැතහොත් භාණ්ඩවලින් දෙන ලද අත්තිකාරම් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා එම ලියාපදිංචි සමිතියේ කාරක සභාවට සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කිරීම අවශ්‍ය බව හෝ අවස්ථාවෝචිත බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන අවස්ථාවක මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් නීතියක හෝ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල හෝ කුමක් සඳහන්ව තිබුණද ඔහු විසින් ඔහුගේ මතය අනුව අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචි සමිතියේ කාරක සභා සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කළ හැකිය. එසේ වුවද එසේ නම් කරන සාමාජික සංඛ්‍යාව ඒ කාරක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් හරි අඩකට අඩු විය යුතුය. එසේ නම් කළ අය අතුරින් සභාපති උප සභාපති හෝ ඒ දෙදෙනාම හෝ නම් කිරීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා සතු වන අතර එම නම් කිරීමත් සමගම ඒ වන විට කාරක සභාවේ එම ධූරය දරන්නන්ගේ සභාපති හා උප සභාපතිධුර එම කරුණින්ම අහෝසි විය යුතුය.වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද මෙසේ නම් කිරීමෙන් පසු කාරක සභාවේ සන පූර්ණය වශයෙන් නම් කරන ලද කාරක සභා සාමාජිකයින්ද ඇතුළුව මුළු කාරක සභික සංඛ්‍යාවෙන් අඩකට වැඩි ප්‍රමාණයකින් සමන්විත විය යුතුය.

*12 වන පරිච්ඡේදය*

**රීති**

58. (1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු රීති විෂයභාර අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

(2) විශේෂයෙන්ම හා (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව ඒ රීතිවලින් -

(අ) සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි හා ඒ ඉල්ලුම් කිරීම් පිණිස කාර්යය පටිපාටිය නියම කළ හැකිය.

(ආ) සාමාජිකයන් වශයෙන් ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කරන හෝ සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලැබූ තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු කොන්දේසි නියම කළ හැකි අතර කලින් කල සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හා ඇතුළත් කර ගැනීම හා සාමාජිකත්වයේ අයිතිවාසිකම් පාවිච්චි කිරීමට පෙර කළ යුතු ගෙවීම් හා ලබාගත යුතු සම්බන්ධතා සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

(ඇ) සාමාජිකයන් ඉල්ලා අස්වීම හා නෙරපීම සඳහාද ඉල්ලා අස්වන හෝ නෙරපනු ලබන සාමාජිකයන්ට කළයුතු ගෙවීම් සඳහාද හිටපු සාමාජිකයන්ගේ වගකීම් සඳහාද විධිවිධාන සැළැස්විය හැකිය.

(ඈ) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව ඒ සමිතිය විසින් සීමා කළ හැකි ප්‍රමාණය නියම කළ හැකිය.

(ඉ) මියගිය සාමාජිකයන්ගේ සම්බන්ධතාවයේ වටිනාකම නිශ්චය කළයුතු ආකාරය සඳහාද ඒ සම්බන්ධතාවයේ වටිනාකම ගෙවිය හැකි හෝ පැවරිය හැකි තැනැත්තෙකු නම් කිරීම සඳහාද විධිවිධාන සැලැස්විය හැකිය.

(ඊ) 3වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සාමාජිකයෙකු සතුව තිබිය හැකි ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග්ධනයේ වැඩිම කොටස් ගණන හෝ පංගුව නියම කළ හැක.

(උ) සමිතියක සාමාජිකයන්ට ලාභ බෙදා දිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි හා සමිති විසින් ගෙවිය හැකි ලාභාංශ පිළිබඳ උපරිම ප්‍රමාණය නියම කළ හැක.

(ඌ) සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම් සඳහාද, ඒ රැස්වීම්වල කාර්ය පටිපාටිය සඳහාද, ඒ රැස්වීම්වලදී පාවිච්චි කළයුතු බලතල සඳහාද, විධිවිධාන සැලස්වීමත් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු කාරක සභාවේදී හෝ ප්‍රාදේශීය හෝ ශාඛා කාරක සභාවක සාමාජිකයෙකු ලෙස තෝරාපත් කර ගැනීම සම්බන්ධයෙන් වූ නුසුදුසුකම් නියම කිරීමක් කළ හැකිය.

(එ) කාරක සභාවල සාමාජිකයන් හා වෙනත් නිලධරයන් පත්කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් ඉවත් කිරීම සඳහා ද කාරක සභා රැස්වීම්වල කාර්යය පටිපාටිය සඳහාද කාරක සභාව හා වෙනත් නිලධරයන් විසින් පාවිච්චි කළ යුතු බලතල හා ඉටුකළ යුතු යුතුකම් සඳහා ද විධිවිධාන සැලැස්විය හැක.

(ඒ) සමිතියක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි හෝ සෑදිය යුතු කරුණු සහ අතුරු ව්‍යවස්ථා සෑදීමේදී වෙනස් කිරීමේදී හා පරිච්ඡින්න කිරීමේදී අනුගමනය කළයුතු කාර්යය පටිපාටිය, ඒ අතුරු ව්‍යවස්ථාව පැනවීමට, වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි නියම කළ හැකිය.

(ඔ) ලියාපදිංචි කළ සමිතියක් විසින් තැබිය යුතු ගිණුම් හා පොත්පත් සහ ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා බැරකම් පෙන්නුම් කරන ශේෂ පත්‍රයක් කලින් කල පළ කිරීමට නියම කළ හැකිය.

(ඕ) ලියාපදිංචි කළ සමිතිවල ගිණුම් විගණනය කිරීම සඳහා සහ ඒ විගණනය සඳහා ගෙවිය යුතු යම් ගාස්තු ඇතොත් ඒ ගාස්තු ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීමද පවත්නා සමිති විගණනය කිරීම, ඒවා පරිපාලනය කිරීම සහ ඒවාට සහාය දීම සඳහා ද සමුපකාර ප්‍රචාරක ව්‍යාපෘති කටයුතු සඳහා ද සමුපකාර අධ්‍යාපනය හා දේශීය හා විදේශීය පුහුණුව සඳහා ද සමුපකාර ව්‍යාපාරයේ කටයුතු කිරීම සඳහා ද නෛතික කටයුතු කිරීමේදී දැරීමට සිදුවිය හැකි සියලුම වැය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට අවශ්‍ය වන අවශ්‍යතා සපයා ගැනීමද පාවිච්චි කිරීම පිණිස මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන දකුණු පළාත් සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුමට සියලුම ලියාපදිංචි කළ සමිතිවලින් හා එවැනි යම් සමිතිවලින් දායක මුදල් අයකිරීමට විධිවිධාන සැලැස්වීමද, සමුපකාර අරමුදල ගෙවීම පැහැරහැරීම් සඳහා වූ විධිවිධානයන් ද ඒ අරමුදල් ගිණුමේ පරිපාලනය හා කළමනාකරණය සඳහා විධිවිධාන සැලැස්වීම ද කළ හැකිය.

(ක) ලියාපදිංචි කළ සමිති විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා සහ ඒ වාර්තා ඉදිරිපත් කළයුතු තැනැත්තන් හා ආකාරය නියම කළ හැකිය.

(ග) ලියාපදිංචි කළ සමිති සතු පොත්පත්වල ඇතුළත්ව ඇති සටහන්වල පිටපතක් සහතික කළ හැකි තැනැත්තන් හා ආකාරය සඳහා විධිවිධාන සැලැස්විය හැකිය.

(ච) සාමාජිකයාගේ නාමලේඛනයක් හා සාමාජිකයන්ගේ වගකීම් කොටස්වලින් සීමා සහිත වූ අවස්ථාවක කොටස් පිළිබඳ නාමලේඛනයක් සකස්කොට පවත්වාගෙන යාම සඳහාද විධිවිධාන සැලැස්විය හැකිය.

(ජ) සංචිත අරමුදලක් ඇතිකොට පවත්වාගෙන යාම හා ඒ අරමුදල් යෙදිය හැකි පරමාර්ථ සඳහා ද ලියාපදිංචි කළ සමිතියක පාලනය යටතේ ඇති යම් අරමුදල් ආයෝජනය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය.

(ට) සමිතියක් වෙත හෝ ඒ මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීමට අදාළ යම් තොරතුරු ව්‍යවස්ථාවක් හෝ ගිවිසුමක් කඩකිරීම පිළිබඳ යම් ප්‍රශ්නයක් නිශ්චය කළ හැකි ආකාරය හා එබඳු යම් කඩකිරීමක් නිසා වූ ප්‍රමාණය කළ අලාභය නිශ්චය කළ හැකි හෝ තක්සේරු කළ හැකි ආකාරය නියම කළ හැක.

(ඩ) බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් පත් කිරීමේ ක්‍රමය හා රෙජිස්ට්‍රාර්වරයා හෝ බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් ඉදිරියේදී පැවැත්වෙන කාර්යයන්හිදී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය හා රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණ හෝ බේරුම්කරුවන්ගේ තීරණ ද ක්‍රියාත්මක කළ යුතු ආකාරය නියම කළ හැකි අතර රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආභියාචනා සඳහා තැන්පත් කළ යුතු මුදල් පිළිබඳ නියම කිරීම කළ හැකිය.

(ණ) රෙජිස්ට්‍රාර්වරයා වෙත ආරවුල්ගත යොමුවක් ඉදිරිපත් කළ යුතු කාල සීමාවන් පිළිබඳ නියමයක් කළ හැකිය.

(ත) සමුපකාර සමිතියක කාරක සභාවක් තෝරා පත්කර ගැනීමට අදාළවන නියමයන් හා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නියමයන් කළ හැකිය.

(ද) වත්කම් මිලදී ගැනීම, අත්පත්කර ගැනීම, විකිණීම සහ බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නියමයන් කළ හැකිය.

(න) රජයෙන් හෝ පළාත් සභාවෙන් මුදල් ආධාර සඳහා ඉල්ලුම් කරන ලියාපදිංචි කළ සමිතියක් විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කළ හැකිය.

(ප) රෙජිස්ට්‍රාර්වරයා විසින් කරන ලද නියෝගවලට විරුද්ධව අමාත්‍යවරයා වෙත ආයාචනයක් ඉදිරිපත් කළ හැකි විය යුතු වුව ද මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නැත්තාවූ ද කරුණු නිශ්චය කළ හැකිය.

(බ) 47වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඈවරකරුවෙකු විසින් අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය හා ඈවරකරුගේ නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කළ හැකි විය යුතු අවස්ථා නියම කළ හැකිය.

(ම) 37(1)(අ) වන අනු උපවගන්තියෙහි සඳහන් සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුමක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම හා එම අරමුදල් ගිණුමේ මුදල් වියදම් කළ හැකි ආකාරය හා කාර්යයන් නියම කිරීම.

(ය) 53(3)වන උපවගන්තියේ සඳහන් අතිරික්ත අරමුදල් ගිණුමක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම හා එම අරමුදලේ මුදල් වියදම් කළ හැකි ආකාරය හා කාර්යයන් නියම කළ හැකිය.

(ර) විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභිකයන් තෝරා පත් කර ගැනීමේ සහ අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිතිවල සමුපකාර නිලවරණ පැවැත්වීමට අදාළ විධිවිධාන සැලැස්වීමට අදාළ කාර්ය පටිපාටි නියම කිරීම හා ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් නියෝග නියම කළ හැකිය.

(ල) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති යටතේ අභියාචනා ඉදිරිපත් කිරීම, විභාග කිරීම හා ඒ පිළිබඳ සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කළ යුතු ආකෘති, ගෙවිය යුතු ගාස්තු, පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය හා එම කරුණු සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් සියලු කරුණු නියම කළ හැකිය.

(3) දකුණු පළාත් සභාව විසින් අනුමත කරනු ලැබුවේ නම් මිස කිසිම රීතියක් බල නොපැවැත්විය යුතුය.

(4) 3 වන උපවගන්තියෙන් නියම නිවේදනය පළාත් සභාවෙන් අනුමත කර ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු සෑම රීතියක්ම මෙහි පනවනු ලැබූවාක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

*13 වන පරිච්ඡේදය*

**රජයේ හෝ පළාත් සභාවට අයවිය යුතු ණය**

59. (1) ලියාපදිංචි කළ සමිතියකින් හෝ ලියාපදිංචි කළ සමිතියක් යම් නිලධරයෙකුගෙන් හෝ සාමාජිකයෙකුගෙන් හෝ එහි හිටපු සාමාජිකයෙකුගෙන් එම තත්ත්වයෙන් රජයේ හෝ පළාත් සභාවේ ණය හා රජය හෝ පළාත් සභාවට ඇප වූ ණය වෙනුවෙන් අයවිය යුතු මුදල් හා රජයට හෝ පළාත් සභාවට ද අයවිය යුතු ණය අයකර ගැනීම සඳහා ආණ්ඩුවේ ණයකරු ආඥාපනත යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්ම අයකරනු ලැබිය හැකි අතර 39(2) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව අන්කිසි තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට අයවිය යුතු මුදල්වලට ඉහළින් ඒවාට ප්‍රමුඛත්වය ලැබිය යුතුය.

සමිතිවලින් රජයට, පළාත් සභාවට අයවිය යුතු ණය අයකිරීමේ විධිවිධාන.

(2) ලියාපදිංචි කළ සමිතියකින් රජයට, පළාත් සභාවට අයවිය යුතු (1) වන උපවගන්තිය යටතේ අයකරගත හැකි මුදල් පළමුව සමිතියේ දේපළවලින් අයකර ගත හැකිය. දෙවනුව සාමාජිකයන්ගේ වගකීම් සීමා කරනු ලැබූ ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට සාමාජිකයාගේ වගකීමේ සීමාවට යටත්ව සාමාජිකයන්ගෙන් ද, තෙවනුව අන් සමිති සම්බන්ධයෙන් වූ විට සාමාජිකයන්ගෙන් ද අයකර ගත හැකිය.

*14 වන පරිච්ඡේදය*

අරමුදල් ගිණුම්

**සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුම හා අතිරික්ත අරමුදල් ගිණුම**

60. (1) දකුණු පළාත තුළ සමුපකාර සංවර්ධන කාර්යය ඉටු කිරීම අරමුණු කර ගත් (මෙහි මින්මතු සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුම වශයෙන් සඳහන් කරන්නා වූ) දකුණු පළාත් සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුම යනුවෙන් හැඳින්වෙන්නා වූ අරමුදල ගිණුමක් පිහිටුවන්නේය.

සමුපකාර සංවර්ධන අරමුදල් පාලන ගිණුම.

(2) මෙම අරමුදල් ගිණුම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ iii වන කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතුය.

(3) මෙම අරමුදල් ගිණුමට පහත සඳහන් මුදල් බැර කළ යුතුය.

(අ) මෙම ප්‍රඥප්තිය 37(1) වගන්තිය යටතේ ලියාපදිංචි සමිතිවලින් ලැබෙන මුදල්,

(ආ) රජයේ හෝ පළාත් සභාවෙන් ලැබෙන අරමුදල් හෝ පරිත්‍යාග,

(ඇ) සමුපකාර සමිතිවලින් හෝ පුද්ගලයන්ගෙන් ලැබෙන යම් ආධාර හෝ පරිත්‍යාග.

(4) මෙහි මින්මතු දැක්වෙන විධිවිධානවලට යටත්ව පහත සඳහන් එක් කාරණයක් හෝ කාර්යයන් කිහිපයක් වෙනුවෙන් එකී අරමුදල් ගිණුමෙන් මුදල් වැය කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් සිදු කළ හැකිය.

(අ) සමුපකාර අධ්‍යාපන ව්‍යාප්තිය, ප්‍රචාරක වැඩ හා පුහුණුව,

(ආ) සමුපකාර සමිතිවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම,

(ඇ) සමුපකාර සමිතිවලට ආධාර කිරීම,

(ඈ) සමුපකාර අරමුදල් ගිණුම කළමනාකරණය කිරීමේ දී අවශ්‍ය වන නෛතික කටයුතුවලදී දැරීමට සිදුවන සියලු වැය,

(ඉ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වන සියලුම නෛතික කටයුතුවලදි දැරීමට සිදුවන සියලු වැය,

(ඊ) සමුපකාර නීතිය යටතේ පවරනු ලබන කාර්යයකදී යම් නිලධාරියෙකුට විරුද්ධව අධිකරණ ක්‍රියා මාර්ගයන් ගනු ලබන අවස්ථාවක දී රජයේ නීති සහාය නොලැබෙන විට ඒ සඳහා නීති සහාය ලබාදීම වෙනුවෙන් දරන වියදම්,

(උ) සමුපකාර සමිති විගණනයේ දී හා සංවර්ධනයේ දී දැරීමට සිදුවන වැය,

(ඌ) සමුපකාර සමිති සාමාජික නාම ලේඛන හා ඡන්ද නාම ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම සඳහා දැරීමට සිදුවන වැය,

(ඍ) සමුපකාර සාමාජිකයා, කාරක සභිකයින්, සමිතියේ සේවකයින් හා එම ව්‍යාපාරය මෙහෙයවීමට සෘජුව සම්බන්ධවන ආයතන හා නිලධාරීන් සඳහා දැරීමට සිදුවන වැය,

(එ) සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුම පරිපාලනය කිරීමේ වැය.

(5) සමුපකාර අරමුදල් ගිණුම පරිපාලනය කිරීමේ කාර්යය සඳහා කොමසාරිස් විසින් හත්දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කළ යුතු අතර එම කමිටුව අරමුදලේ පාලක මණ්ඩලය වන්නේ ය. එම කමිටුව,

(අ) රෙජිස්ට්‍රාර්වරයා කමිටුවේ සභාපති වශයෙන් ද, සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (පාලන), විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ලද අමාත්‍යාංශ නිලධාරියකු, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (සංවර්ධන), දිස්ත්‍රික් තුන නියෝජනය වීම සඳහා එක් සහකාර කොමසාරිස්වරයෙකු, දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී හා සමුපකාර සමිති නියෝජනය වීම සඳහා දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල තුනෙහි අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් අතුරින් එක් අයෙකු ද සමන්විත විය යුතුය.

(ආ) කමිටු රැස්වීමක සනපූර්ණය 4 ක් විය යුතු අතර, අවශ්‍ය අවස්ථාවල කමිටුව රැස්වී ලැබී ඇති ඉල්ලීම් සළකා බලා මුදල් ගෙවීම සඳහා තීරණය ගත යුතුය.

(6) (අ) සමුපකාර අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(ආ) සැම වර්ෂයක්ම අවසන් වී මාස 03ක් ඇතුළත අරමුදල් ගිණුම පිළිබඳ වාර්තාවක් රෙජිස්ට්‍රාර්වරයා විසින් සමුපකාර විෂය භාර අමාත්‍යාංශ ලේකම් මගින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ) රාජ්‍ය ආයතනවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන දකුණු පළාත් සභා රීති සමුපකාර අරමුදල් ගිණුමේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

61. (1) ලියාපදිංචිය අවලංගු කරන ලද සමිතිවල ගණන් බේරා වසා දැමීමේ කාර්යය ඉටු කිරීම සඳහා (මෙහි මින්මතු අතිරික්ත අරමුදල් ගිණුම වශයෙන් සඳහන් කරන්නා වූ) දකුණු පළාතේ මෙම අතිරික්ත අරමුදල් ගිණුම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වැනි කොටසේ විධිවිධානවලට අනුකූල විය යුතුය. අතිරික්ත අරමුදල.

(2) මෙම අතිරික්ත අරමුදල් ගිණුමට පහත සඳහන් මුදල් බැර කළ යුතුය.

(අ) ලියාපදිංචිය අවලංගු කරන අවස්ථාවේ දී සමිතියක බැංකු ගිණුම්වල පැවති මුදල් හා ඉතිරි අරමුදල් ශේෂ

(ආ) ඇවරකරුවන් විසින් අයකරනු ලබන මුදල්

(ඇ) ලියාපදිංචිය අවලංගු කිරීමට පෙරාතුව සිදුකරන ලද ගණුදෙනුවක් සඳහා ලැබිය හැකි ඕනෑම ආකාරයක මුදල්

(ඈ) වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන මුදල්

(3) මෙම ප්‍රඥප්තිය 52 (1) හා (2) උප වගන්තිවල දැක්වෙන කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර් විසින් මෙම අරමුදලින් මුදල් වැය කළ හැකිය. එසේ වුවද එවැනි යම් සමිතියක් වෙනුවෙන් කරන ගෙවීම්, එම සමිතිය වෙනුවෙන් ලැබී ඇති මුදල් නොඉක්මවිය යුතුය.

(4) ඉහත 3 උපවගන්තියේ සඳහන් කාර්යය සඳහා මුදල් යෙදවීමෙන් පසුව යම් අතිරික්තයක් ඇතිවුවහොත් එම අතිරික්ත පහත සඳහන් කාර්යයක් හෝ කාර්යයන් වෙනුවෙන් වැය කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් කළ හැකිය.

(අ) ඕනෑම ලියාපදිංචි කරන ලද ප්‍රාථමික සමිතියක කොටස් මිලයට ගැනීම හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කළ හැකි වෙනත් ආකාරයකට හෝ එවැනි සමිතියකට ආධාර කිරීමට,

(ආ) ලියාපදිංචි කරන ලද සමිතියකට ස්ථාවර වත්කම් මිලයට ගැනීමට ආධාර කිරීමට

(ඇ) ඇවරකරුවෙකුට විරුද්ධව ඇති සිවිල් නඩුවකදී ඔහුගේ නිදහසට ක්‍රියා කිරීමට ඔහුට ආධාර කිරීමට,

(ඈ) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන හා පිහිටුවන ලද ඕනෑම ලියාපදිංචි කළ සමිතියකට හෝ ලියාපදිංචි කළ සමිතිවලට ආධාර කිරීමේ කටයුත්ත සඳහා වෙනත් ආයතනයකට හෝ ආධාර කිරීමට,

(ඉ) සමුපකාර සංවර්ධන අරමුදල් ගිණුම පරිපාලනය කිරීමේ වැය

(5) අතිරික්ත අරමුදල් ගිණුම පරිපාලනය කිරීමේ කාර්යය සඳහා කොමසාරිස් විසින් පස් දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කළ යුතු අතර, එම කමිටුව අතිරික්ත අරමුදලේ පාලක මණ්ඩලය වන්නේය. එම කමිටුව,

(අ) රෙජිස්ට්‍රාර්වරයා කමිටුවේ සභාපති වශයෙන් ද, සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (පාලන), විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරන ලද අමාත්‍යාංශ නිලධාරියෙකු, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වරයෙකු, දෙපාර්තමේන්තුවේ හා ගණකාධිකාරී යන අයගෙන් සමන්විත විය යුතුය.

(ආ) කමිටු රැස්වීමක සනපූර්ණය 3ක් විය යුතු අතර, අවශ්‍ය අවස්ථාවල කමිටුව රැස්වී ලැබී ඇති ඉල්ලීම් සළකා බලා මුදල් ගෙවීම සඳහා තීරණය ගත යුතුය.

(6) (අ) අතිරික්ත අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

(ආ) සෑම වර්ෂයක්ම අවසන් වී මාස 03ක් ඇතුළත අරමුදල් ගිණුම පිළිබඳ වාර්තාවක් රෙජිස්ට්‍රාර් විසින් සමුපකාර විෂය භාර අමාත්‍යාංශ ලේකම් මගින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ) රාජ්‍ය ආයතන ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තියේ විධිවිධාන දකුණු පළාත් සභා රීති අතිරික්ත අරමුදල් ගිණුම විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

### *15 වන පරිච්ඡේදය*

### විවිධ කරුණු

ලියාපදිංචි කිරීම් සම්බන්ධයෙන් වූ නියමයන්ගෙන් යම් සමිතියක් නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය.

62. මෙම ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව ඇත්ද එය නොතකා අමාත්‍යවරයා විසින් එක් එක් අවස්ථාවෙහි විශේෂ නියෝගයකින් හා ඔහු විසින් නියම කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියෙහි වූ නියමයන්ගෙන් යම් නියමයකින් යම් සමිතියක් නිදහස් කළ හැකිය.

මේ ප්‍රඥප්තියෙහි විධිවිධානවලින් සමිති නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය.

63. අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක් මාර්ගයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට යම් විධිවිධානයකින් ලියාපදිංචි කළ යම් සමිතියක් හෝ සමිති පන්තියක් නිදහස් කිරීම හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් දිනක සිට යම් වෙනස් කිරීම් සහිතව ඒ විධිවිධාන යම් සමිතියකට හෝ සමිති පන්තියකට අදාළ විය යුතු යැයි විධාන කිරීම කළ හැකිය.

සමුපකාරය යන වචනය සීමා කිරීම.

64. (1) "එක්සත් සහකාර" යන වචනය හෝ " සමුපකාර" යන වචනය හෝ දෙමළ භාෂාවෙන්"අයික්කිය" යන වචනය හෝ "කුට්ටුරවු" යන වචනය හෝ ඉංග්‍රීසි භාෂාවෙන් "කෝපරේටිව්" යන වචනය හෝ කොටසක් යන නම් නාමයක් හෝ අභිධානයක් යටතේ වෙළඳාම් කිරීම හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ලියාපදිංචි කළ සමිතියක් නොවන කිසිම තැනැත්තෙකු විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව නොකළ යුතුය.

එසේ වුවද 1921 සැප්තැම්බර් මස 22 වන දිනට පෙර යම් තැනැත්තෙකු විසින් වෙළෙඳාමක් කර ගෙන යන ලද්දේ හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලද්දේ යම් නාමයක් හෝ අභිධානයක් යටතේ ද ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ සම්බන්ධතාවයෙහි අනුප්‍රාප්තිකයා විසින් ඒ නාමය හෝ අභිධානය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් මේ වගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතුය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන කවර තැනැත්තෙකු වුවද මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහස දක්වා විය හැකි දඩයකට හා වරද අඛණ්ඩව පවත්වාගෙනු ලබන අවස්ථාවක් වූ විට ඒ වරද වරදකරු කරනු ලැබීමෙන් පසු තව දුරටත් ඒ වරද කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් සියයක අතිරේක දඩයකට ද යටත්විය යුතුය.

65. (1) ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් 39 වන වගන්තිය යටතේ විගණනයක දී හෝ 41 වන වගන්තිය යටතේ විභාගයකදී හෝ සමිතියේ පොත් පරීක්ෂා කර බැලීමේ දී හෝ ගණන් බේරා වසා දැමීමේ දී ඒ සමිතිය සංවිධානය කිරීමෙහිලා හෝ එහි කළමනාකාරීත්වයෙහිලා හෝ සහභාගී වූ මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් ප්‍රඥප්තියක විධිවිධානවලට හෝ ඒ යටතේ සාධන රීතිවලට හෝ නැතහොත් සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ කාරක නියෝගවලට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද මුදල් කාර්ය පටිපාටියෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් පොදු විධිවිධානවලට පටහැනිව සමිතියේ අරමුදල් ප්‍රයෝජනයට ගත් යම් තැනැත්තෙකුගෙන් හෝ තැනැත්තන් කණ්ඩායමකින් හෝ සමිතියේ සිටි හෝ දැනට සිටින යම් නිලධරයෙකුගෙන් හෝ සේවකයෙකුගෙන් ඒ සමිතියට යම් මුදලක් හෝ අන් දේපළක් ලැබිය යුතු බව පෙනෙන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර්වරයා විසින් තමාගේ ඉල්ලීම පිට හෝ සමිතියේ කාරක සභාවේ හෝ ඇවරකරුගේ හෝ යම් ණයහිමියෙකුගේ දායකයෙකුගේ ඉල්ලීම පිට තැනැත්තාගේ හෝ තැනැත්තන් කණ්ඩායමේ හෝ නිලධරයන් හෝ සේවකයන්ගේ ක්‍රියා කළාපය සම්බන්ධයෙන් පරීක්ෂා කර,

(අ) ඒ මුදල හෝ එහි කොටසක් රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන පොළියක් සමග ආපසු ගෙවන ලෙස,

(ආ) ඒ අන් දේපළ හෝ එයින් කොටසක් ආපසු භාරදෙන ලෙස, හෝ

(ඇ) සමිතියේ වත්කම්වලට සුදුසු යැයි අදහස් කරනු ලබන යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවන ලෙස ,

ඔහුට හෝ ඒ කණ්ඩායමට නියෝග කළ හැකිය. එවැනි යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට විරුද්ධව එබඳු යම් නියෝගයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැක්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන් කණ්ඩායමට අවස්ථාවක් දිය යුතුය. එම තැනැත්තා සේවකයෙකු නම් ඔහුගේ සේවය තහනම් කරන ලෙස කාරක සභාවට නියෝග කළ හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් මුදලක් ආපසු ගෙවීම සඳහා හෝ එහි වත්කම්වලට යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවීම සඳහා (1) වන උප වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියාකර නොමැති අවස්ථාවක සමිතියේ ලියාපදිංචි කළ ව්‍යාපාර ස්ථානය පිහිටි හෝ නියෝගය කරන ලද්දේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් නිලධාරියෙකුට හෝ සේවකයෙකුට විරුද්ධව ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධාරියා හෝ සේවකයා පදිංචිව සිටින හෝ ව්‍යාපාරය කරගෙන යන ස්ථානය පිහිටි කොට්ඨාසය තුළ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත මෙම ප්‍රඥප්තියේ 54(1)(ආ) වගන්තිය ප්‍රකාර සහතිකයක් මගින් ඉල්ලුම්කොට ඒ මුදල බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සඳහා ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම නිලධරයා හෝ සේවකයා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාගේ හෝ දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් වූවාක් මෙන් අයකරනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 291 වගන්තියෙහි (එම වගන්තියේ (i) වන උප වගන්තිය (අ) සහ (ඇ) ඡේද හැර) විධිවිධාන ඉක්බිතිව අදාළ විය යුතුය. තවද ඒ දණ්ඩනය නියම කරන අවස්ථාවේ දී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් නියම කළ හැකිව තිබූ යම් විධානයක් ද ඔහු විසින් කළ හැකිය. රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලැබූ යම් නියෝගයක නිරවද්‍යතාව මේ වගන්තිය යටතේ කිසිම නීති කෘත්‍යකදී සළකා බැලීමට, පරීක්ෂා කිරීම හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට මේ වගන්තියේ කිසිවකින් බලය ලැබීම හෝ නියම වීම සිදු නොවිය යුතුය.

(3) අන් කිසි ලිඛිත නීතියක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් (1) වන උප වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් නිලධාරියෙකුට හෝ සේවකයෙකුට විරුද්ධව නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම මේ වගන්තිය පෙරාතුව වූ විධිවිධාන හෝ ඒ යටතේ යම් නියෝගයක් කිරීම හේතුකොට ගෙන වැළැක්වෙන ලෙස හෝ ඒ කෙරෙහි වෙන යම් ආකාරයකින් බලපාන ලෙස සළකනු ලැබීම හෝ තේරුම් ගැනීම නොකළ යුතුය.

වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම හා දිවුරුම් ප්‍රකාශ.

66. (1) ලියාපදිංචි සමුපකාර සමිතියක සභාපතිවරයා විසින් සහ කාරක සභාවේ සෑම සාමාජිකයෙකු විසින්ම වාර්ෂිකව රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත ආකෘතියෙහි වූ වත්කම් හා බැරකම් ප්‍රකාශයක්, ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ඒ ප්‍රකාශය කරන්නේ යම් වර්ෂයක් වෙනුවෙන්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පැවති පරිදි,

(අ) ඔහුගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳව ද,

(ආ) ඔහුගේ කලත්‍රයාගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳව සහ

(ඇ) ඔහුගේ එක් එක් දරුවාගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

(2) (1) වන උප වගන්තියේ සඳහන් ප්‍රකාශය ලියාපදිංචි සමිතියක සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයෙකු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත අවස්ථාවෝචිත පරිදි වූ සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයා තෝරා පත්කර ගනු ලැබූ හෝ පත්කරනු ලැබූ දින සිට මාස 03ක් ඇතුළත ද ඔහු සභාපති ධූරයේ හෝ කාරක සභාවේ සාමාජික ධූරය දැරීම නතර වුවහොත් මිස ඔහු ප්‍රථම ප්‍රකාශය කළ වර්ෂයෙන් පසුව එළඹෙන එක් එක් අනුක්‍රමික වර්ෂයෙන් ජූලි මස පළමුවන දිනට පෙර ද කළ යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක කාරක සභාවට හෝ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශික කාරක සභාවකට හෝ තෝරාපත් කර ගනු ලැබූ කෙනෙක් එසේ තෝරාපත් වී දින 14 ක් තුළ ලියාපදිංචි තැපෑලෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත තමා එසේ තෝරාපත් කිරීමට නුසුදුසු නොවන බවට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

(4) ඉහත (2) සහ (3) වන උප වගන්ති ප්‍රකාරව කටයුතු කිරීම පැහැර හරින තැනැත්තෙකුගේ ධූරය එම කරුණින්ම අහෝසි වන්නේ ය. එසේ ධූරය අහෝසි වන දින සිට ඉතිරි ධූර කාලය තෙක් එම සමිතියේ කිසිදු ධූරයකට පත් කිරීමට නුසුදුස්සෙකු වන්නේය.

(5) ඉහත (2) සහ (3) වන උප වගන්ති අනුව කරන ලද ප්‍රකාශයන් අසත්‍ය බවට තහවුරු වුවහොත් එදින සිට වර්ෂ හතක් ගතවන තුරු කිසිදු සමුපකාර සමිතියක කිසිම ධූරයක් දැරීමට නුසුදුස්සෙකු වන්නේය.

විශ්වාසය කඩ කිරීම හා ඒ සඳහා වන දඬුවම.

67. ලියාපදිංචි කළ සමිතියක ගණන් 39 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විගණනය කිරීමෙන් පසුව හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව සමිතියේ නිලධරයෙකු හෝ සාමාජිකයෙකු හෝ සේවකයෙකු වශයෙන් වූ තම තත්ත්වයෙන් යම් මුදලක් යම් බඩු හෝ දේපළ භාරව සිටින හෝ යම් අවස්ථාවක භාරව සිටි නැතහොත් ඒ මුදල් බඩු හෝ දේපළ පිළිබඳ ආධිපත්‍යය ඇතිව සිටින හෝ යම් අවස්ථාවක ඇතිව සිටි හෝ තැනැත්තෙකු විසින් ඒ නිලධරයා සාමාජිකයා හෝ සේවකයා වශයෙන් තමා ලඟ තබාගෙන සිටින හෝ තමාගෙන් අයවිය යුතු බවට තමා විසින් තබන ලද හෝ අත්සන් කරන ලද ගණන් පොත්වල හෝ ප්‍රකාශවල පෙන්නුම් කෙරෙන යම් මුදලක් හෝ එහි ශේෂයක් හෝ අයථා ලෙස පරිහරණය කරන ලද යම් මුදලක් හෝ ගෙවන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි යම් බඩුවල හෝ දේපළවල වටිනාකම ගෙවන ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය.

තවද එසේ නියම කිරීම කරනු ලැබීමෙන් පසුව ඒ තැනැත්තා විසින් ඒ මුදල හෝ එහි ශේෂය හෝ වටිනාකම ගෙවීම හෝ ඉදිරිපත් කිරීම හෝ එම බඩුවල හෝ දේපළවල වටිනාකම ගෙවීම යථා පරිදි ඒ සඳහා ගණන් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත් ඔහු සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 10ක් නොඉක්මවන කාල සීමාවකට දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට යටත්විය යුතුවාක් මෙන්ම, දඩයකට ද යටත්විය යුතු අතර ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයෙකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්ම වුවද එය නොතකා ක්‍රියාත්මක කළ හැකි විය යුතුය.

පාලක මණ්ඩල පත් කිරීමේ බලය.

68. (1) (අ) සෑම ලියාපදිංචි සමුපකාර සමිතියකම එකී සමුපකාර සමිතියේ අනුමත අතුරු ව්‍යවස්ථාවෙන් නියමකර ඇති කාරක සභා නිල කාලය ඉකුත් වී මාස තුනක් ගත වීමට පෙර නව කාරක සභාවක් පත්කර ගැනීමට කටයුතු කිරීම තත්කාලයේ කාරක සභාවේ වගකීම වන්නේය.

(ආ) එසේ නොකරන්නේනම් එකී කාරක සභාව අහෝසි වූවා සේ සලකා කොමසාරිස්වරයා විසින් පාලක මණ්ඩලයක් පත්කළ යුතුය. එකී පාලක මණ්ඩලයට සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවක බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(ඇ) එකී පාලක මණ්ඩලය විසින් මාස හයක් ඇතුළත අතුරු ව්‍යවස්ථානුකූලව මහා සභාවක් කැඳවා කාරක සභාව පත්කර ගැනීමට කටයුතු කළ යුතුය.

(2) (අ) තවද පහත සඳහන් කවර හෝ අවස්ථාවක දී වුවද පාලක මණ්ඩලයක් පත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත්තේය.

(i) කාරක සභාව ඉල්ලා අස් වී ඇති නමුත් අලුතින් කාරක සභාවක් පත් කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීම,

(ii) මහා සභාව විසින් කාරක සභාවක් පත් කිරීම, පැහැර හැරීම හෝ කාරක සභාවක් පත්කරගනු ලැබීමට කටයුතු නොකිරීම,

(iii) සමිතියේ පරිපාලනය යම් නිශ්චිත කාලයකට රෙජිස්ට්‍රාර් විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් කළ යුතු බවට මහා සභාව යෝජනා සම්මත කිරීම.

(ආ) එකී පාලක මණ්ඩලය විසින් මාස හයක් ඇතුළත අතුරු ව්‍යවස්ථානුකූලව මහා සභාවක් කැඳවා කාරක සභාව පත්කරගැනීමට කටයුතු කළයුතුය. එකී පාලක මණ්ඩලයට සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවක බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(3) (අ) තවද ඉහත 68(1) අ වගන්තිය පරිදි කටයුතු කිරීම නොහැකි වන පරිදි අධිකරණයක් මගින් අතුරු තහනම් නියෝගයක් ලබා දී ඇති අවස්ථාවක දී නැතහොත් අධිකරණ අතුරු නියෝගයක් හෝ නියමයන් හේතුවෙන් කාරක සභාව හෝ මහ සභාව අකර්මන්‍ය වී ඇති අවස්ථාවක දී, කොමසාරිස් විසින් මෝෂමක් මගින් අධිකරණයට කරුණු ඉදිරිපත් කර පාලක මණ්ඩලයක් පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. එකී පාලක මණ්ඩලයට සමිතියේ යථා පරිදි පත් කරන ලද කාරක සභාවක බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාත්මක කළ හැකිය.

(ආ) එකී පාලක මණ්ඩලය විසින් අධිකරණය වෙනත් ආකාරයකට නියම කළහොත් මිස මාස හයක් ඇතුළත අතුරු ව්‍යවස්ථානුකූලව මහා සභාවක් කැඳවා කාරක සභාව පත්කර ගැනීමට කටයුතු කළ යුතුය.

(4) මෙම වගන්තියට අමතරව මෙම ප්‍රඥප්තියේ 38, 43, 56 හා 57 යන වගන්තිවලින්ද පාලක මණ්ඩල පත්කිරීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා වෙත ඇත්තේය.

(5) මෙම ප්‍රඥප්තියේ 38, 43, 56, 57 හා 68 වගන්ති යටතේ කොමසාරිස්වරයා විසින් සිදුකරනු ලබන, සියළු පාලක මණ්ඩල පත්කිරීම් වලදී විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතු ය.

69. ලියාපදිංචි කළ සමිතියක අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් විමර්ෂණය පැවැත්වීම, විභාග කිරීම සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XVII පරිච්ඡේදයේ සඳහන් නඩු පැවරීම මෙහෙයවීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරියෙකු විසින් කිරීම නීත්‍යානුකූල වන්නේය. *නඩු පැවරීම මෙහෙයවීම කවුරුන් කළ යුතුද යන වග.*

70. අන් කිසි ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා රෙජිස්ට්‍රාර්වරයා විසින් අවශ්‍ය යැයි ඔහු අදහස් කරන අවස්ථාවක *යම් තොරතුරක් යනාදිය ඉදිරිපත් කරන රෙජිස්ට්‍රාර්වරයා විසින් බැංකුවට නියම කළ ඇති බව.*

(අ) යම් කිසි ලියාපදිංචි සමිතියක් විසින් බැංකුව සමග කරනු ලබන ගණුදෙනු සම්බන්ධයෙන් යම් තොරතුරක් සපයන ලෙස, හෝ

(ආ) බැංකු සමග පවතින ඒ සමිතියේ ගිණුම් පෙන්නුම් කරන පිටපතක් බැංකු විසින් තබා ඇති ලෙජරයෙන් ඉදිරිපත් කරන ලෙස, හෝ

(ඇ) සමිතියේ බැරට ගෙවන ලද සමිතිය විසින් පිටසන් කරන ලද යම් චෙක්පතක් ඉදිරිපත් කරන ලෙස, යම් බැංකුවකට නියම කළ හැකිය.

සමාගම් පනත හා වෘත්තීය සමිති.

71. සමාගම් පනත හා වෘත්තීය සමිති ආඥාපනතේ විධිවිධාන හා ඒ පනත් සංශෝධනය කරන යම් ප්‍රඥප්තිවල විධිවිධාන මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමිතිවලට අදාළ නොවිය යුතුය.

දැනට පවත්නා පනත රීති යනාදිය පිළිබඳ ඉතිරි කටයුතු කිරීම පිළිබඳ බලය හා සංශෝධනය කිරීම.

72. (1) 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමග 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර පනත යටතේ හා 1970 අංක 35 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත හා 1970 අංක 34 දරන සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත යටතේ ලියාපදිංචි කර ඇති සමුපකාර සමිති මෙම ප්‍රඥප්තිය යටතේ ලියාදිංචි කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, මෙහි සඳහන් සියළු කටයුතු කිරීමට බලය තිබිය යුතුය. එබඳු වූ යම් සමිතියක සේවකයින් හෝ නිලධරයන් අතුරු ව්‍යවස්ථා කාරක නියෝග රීති, ආරවුල්, අභියාචනා හෝ යම් නීති කෘත්‍යයන් සියල්ලක් මෙම ප්‍රඥප්තිය යටතේ කළාවූ කටයුතු ලෙස සැලකිය යුතු වන්නේය.

(2) මෙම ප්‍රඥප්තිය ආරම්භ වන අවස්ථාවේ බලපවත්නා සියලු රීති ඒවා ප්‍රඥප්තියේ විධිවිධාන සමග ගැලපෙන පමණට මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ රීති වෙනුවට 58 වන වගන්තිය යටතේ අලුත් රීති සාදනු ලබන තෙක් ඒවා අඛණ්ඩව බලපැවැත්විය යුතුය.

(3) මෙම ප්‍රඥප්තිය මගින් කටයුතු ආරම්භ කිරීමට යම් පනතක් යටතේ කරන ලද හෝ කරන ලදැයි සැලකෙන සියලු පත්කිරීම් සහ නියෝග නිකුත් කරනු ලැබූ නිකුත් කරන ලදැයි සැලකෙන සියලු නිවේදන හා දැන්වීම් බේරුම්කරුවන් විසින් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන සියලු තීරණ පවරනු ලබන හෝ පවරනු ලදැයි සැලකෙන සියලු සිවිල් නඩු හා වෙනත් නඩු කටයුතු සහ උද්ගතව ඇති සියලු ආරවුල් හැකිතාක් දුරට පිළිවෙළින් මෙම ප්‍රඥප්තිය යටතේ කරනු ලැබූ ලෙස නිකුත් කරනු ලැබූ ලෙස හා උද්ගතවූ ලෙස සලකනු ලැබිය යුතුය.

ප්‍රඥප්තිය අනුව ක්‍රියා නොකිරීම සඳහා දණ්ඩනය.

73. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු විසින් නියම කරන ලද යම් ක්‍රියාවක් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ඕනෑකමින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු සහ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් කැඳවීමේ නියෝගයකට හෝ නීත්‍යානුකූල ලිඛිත නියෝගයකට ඕනෑකමින් හෝ යම් සාධාරණ හේතුවක් නොමැතිව අකීකරු වන හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් තොරතුරක් සපයන ලෙස නියම කිරීමට බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් එසේ සැපයීමට නීත්‍යානුකූලව නියම කරන ලද යම් තොරතුරක් සැපයීම පැහැර හරින සෑම තැනැත්තෙකුම සහ ඕනෑකමින් අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වරදක් සිදුකරන සෑම තැනැත්තෙකුම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 02 ක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් පනස්දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ ඒ දඬුවම මහෙස්ත්‍රාත්වරයෙකු සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවුවද ඔහු යටත් විය යුතු ය.

(3) ඉහත (2) උපවගන්තිය යටතේ දණ්ඩනයකට ලක්වන තැනැත්තෙකුට ලියාපදිංචි කිසිදු සමුපකාර සමිතියක ධුරයක් දැරීම හෝ ධුරයකට පත්වීමට නුසුදුස්සෙකු වන්නේය.

74. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ ප්‍රඥප්තිය යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක කරන ලද යම් යුතුකමක් කඩකිරීමක් වේද ඒ යුතුකම ඉටු කිරීමට අතුරු ව්‍යවස්ථාවලින් හෝ නියෝගවලින් බැඳී සිටින එම සමිතියේ සෑම නිලධරයෙකුම හෝ එබඳු නිලධරයෙක් නොසිටී නම් කාරක සභාවේ සෑම සාමාජිකයෙක්ම ඒ සාමාජිකයා ඒ වරද කිරීම ගැන නොදැන සිටීම හෝ එය වැළැක්වීමට ප්‍රයත්න දැරූ බව ඔප්පු කරනු ලැබූවහොත් මිස ඔහු විසින් ඒ වරද කරන ලද්දේ නම් ඔහු යටත් විය යුතු වන දණ්ඩනයටම යටත් විය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී හෝ කර්තව්‍ය කිරීමේදී සත්භාවයෙන් කරන ලද හෝ කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට, නියෝජ්‍ය කොමසාරිස්වරයන්ට, ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්වරයන්ට, සහකාර කොමසාරිස්වරයන්ට හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධානයන් යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යථා පරිදි බලය දෙන ලද හෝ පත්කරන ලද වෙනත් තැනැත්තන්ට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා ආදීන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

75. මෙම ප්‍රඥප්තියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණයට එරෙහිව හා මෙම ප්‍රඥප්තිය මත රෙජිස්ට්‍රාර්වරයා විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට එරෙහිව නීති කෘත්‍යයන් පවත්වාගෙන යාම සඳහා සමිතියේ මුදලින් කිසිදු වැය බරක් දැරීමට ලියාපදිංචි සමුපකාර සමිතියකට බලය නැති වන්නේය.

76. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ "අතුරු ව්‍යවස්ථා" යන්නෙන් තත්කාලයෙහි දකුණු පළාත තුළ බල පවත්වා ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථා අදහස් වන අතර, ඊට අදාළ ව්‍යවස්ථාවල ලියාපදිංචි කළ සංශෝධනයෙන් ද ඇතුළත් වේ ඃ

"කාරක සභාව"යන්නෙන් ලියාපදිංචි කළ සමිතිය කටයුතු පිළිබඳ කළමනාකාරීත්වය භාරකරනු ලැබූ ඒ සමිතියේ පාලක මණ්ඩලය අදහස් වන අතර, ලියාපදිංචි කළ සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය සහ 43, 44 සහ 55 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පත්කරන ලද තැනැත්තෝ ද ඊට ඇතුළත් වෙති ;

"නිලධරයා" යන්නට සමිතියක හෝ යම් ශාඛාවක සභාපතිවරයා, උපසභාපතිවරයා, භාණ්ඩාගාරිකවරයා, සභිකයන් අතුරින් තේරීපත්වී ඇති ලේකම්වරයා හෝ වෙනත් කාරක සභිකයෙකු ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන් දකුණු පළාත් සභාව අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන් දකුණු පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා හැඳින්වේ ;

"මූලික සමිතිය" යන්නෙන් 3(1)(ආ), (ඇ) හා (ඈ) ඡේදවල සඳහන් යම් අරමුණක් ඇතිව හෝ යම් කාර්යයක් සඳහා පිහිටුවන ලද සමිතිය නොවන ලියාපදිංචි කළ සමිතියක් අදහස් වේ ;

"රීතිය" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ හෝ පනවනු ලැබූ ලෙස සැලකෙන රීති අදහස් වන්නේය ;

"සේවකයා" යන්නට සමුපකාර සමිතියේ අරමුදලින් වැටුප් ලබන සේවය කරන තැනැත්තා වන්නේය ;

"රජයේ අරමුදල" යන්නෙන් රජය විසින් හෝ පළාත් සභාව විසින් දෙනු ලබන ණය අත්තිකාරම් ආධාර සහ ප්‍රදාන අදහස් වන අතර ප්‍රඥප්තියේ 61,62 වගන්තිවලින් සඳහන් අරමුදල්වලින් දෙනු ලබන ණය අත්තිකාරම් ප්‍රදාන හා ආධාර ද රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශය මත හෝ අනුමැතිය මත වෙනත් ආයතනවලින් ලබා ගන්නා සියලුම මුදල් හා ණය හා රෙජිස්ට්‍රාර්වරයා ගෙවිය යුතු මුදල් ඇතුළත් වේ ;

"රෙජිස්ට්‍රාර්වරයා යන්නෙන්" මේ ප්‍රඥප්තිය යටතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් කෙනෙකුගේ යුතුකම් ඉටු කිරීම සඳහා පත්කරන ලද දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් අදහස් වේ ;

"සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධරයා" යන්න මෙම ප්‍රඥප්තියේ 2(1) හා 2(2) වගන්තිය යටතේ කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයාට සහාය වීම සඳහා පත් කරනු ලබන සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්, සමුපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ පළාත් සහකාර කොමසාරිස්, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, දිස්ත්‍රික් සංවර්ධන නිලධාරීන්, මූලස්ථාන සංවර්ධන නිලධාරීන්, සමුපකාර සංවර්ධන නිලධාරීන් අයත් වන්නේය ;

"ලියාපදිංචි කළ සමිතිය" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකෙන සමිතියක් හෝ සංගමයක් අදහස් වේ ;

"සාමාජිකයා" යන්නට සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට වන තැනැත්තන් ද ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු නියෝග සහ අතුරු ව්‍යවස්ථා අනුව සාමාජිකත්වයට ඇතුළත් කර ගන්නා ලද තැනැත්තෙක්ද ඇතුළත් වේ ;

"පූර්ණ සාමාජිකයා" අතුරු ව්‍යවස්ථාවෙන් නියම කරනු ලබන කොටස් මුදල සම්පූර්ණ කර ඇති හා සාමාජිකත්වයෙන් අනුමත කර වර්ෂයක් ගත වූ කෙනෙක් විය යුතුය. පූර්ණ සාමාජිකත්වයට ඇතුළත් කිරීමට කොටස් මුදල වර්ෂයක් තුළ සම්පූර්ණ කරගත් අයකු විය යුතුය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

77. මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

04 - 888

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.